2020

# ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳව නැවත සිතා බැලීම: ප්‍රතිසංස්කරණ සඳහා අදහස්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 නොවැම්බර්

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

නො. 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන: +9411 2081384, +94112081385, +94112081386
ෆැක්ස්: +9411 2081388
වෙබ්: www.cpalanka.org
ඊමේල්: info@cpalanka.org
ෆේස්බුක්: www.facebook.com/cpasl
ට්විටර්: @cpasl

# පටුන


**1. හැඳින්වීම ........ 3**

**2. ශ්‍රී ලංකාවේ නීතිපති ධූරයෙහි ඉතිහාසය ........ 7**

**3. නීතිපතිවරයා ප්‍රධාන අභිචෝදක වශයෙන් ........ 9**

3.1. නීතිපතිවරයාගේ අභිචෝදක අභිමතය සහ අධිකරණ අධීක්ෂණය ........ 9

3.2. නීතිපති කාර්යාලයෙහි දේශපාලනීකරණය වීම සහ රාජකාරි ඉටු කිරීමේදී දේශපාලන මැදිහත්වීම් ........ 13

3.3. යුක්තිය පසිඳලීමට අදාළ ගැටළු ........ 18

3.4. රජයේ අභිචෝදකවරයාගේ කාර්යාලයක් හඳුන්වාදීමේ යෝජනාව ........ 20

**4. ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේදී නීතිපතිගේ කාර්යභාරය ........ 23**

4.1. පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකය පිහිටුවීම සඳහා වූ යෝජනාව ........ 24

**5. රජයේ උපදේශක ලෙස නීතිපති ........ 28**

**6. නිගමනය ........ 31**

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා යනු රජයේ ප්‍රධාන නීති නිලධාරියා වන අතර නීති වෘත්තියේ ප්‍රධානියා ලෙස සැලකේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා ව්‍යවස්ථාපිත විධිවිධාන මෙන්ම සම්මුති මඟින් නිර්වචනය කර ඇති ඔහුගේ රාජකාරි තත්වයන්, වරප්‍රසාද සහ වගකීම් සම්බන්ධයෙන් නීතිපතිවරයාට සුවිශේෂී ව්‍යවස්ථාමය තත්වයක් හිමි වී ඇත. කෙසේ වෙතත්, වඩා දියුණු රටවල, වෙනම හෝ නම් කරන ලද කාර්යාල මගින් සිදු කරනු ලබන්නා වූ විවිධාකාර කාර්යයන් සහ කර්තව්‍යයන්, පොදුරාජ්‍ය මණ්ඩලීය නීතිපතිවරයාගේ ආකෘතිය අනුගමනය කිරීම, ශ්‍රී ලංකාවේ නීතිපති කාර්යාලයේ විකාශනය සහ නීති පද්ධතියේ ඇති වූ සංකීර්ණත්වය හා ව්‍යාප්තිය යන සියල්ල හේතු කොටගෙන, මෙරටේ නීතිපති දෙපාර්තමේන්තුව මඟින්ම සිදු කිරීම දැකිය හැකිය. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරනු ලැබුවහොත්, නීතිපති නම් වූ ආයතනයෙහි සංකීර්ණ ස්වභාවය හේතුවෙන්ම දශක ගණනාවක් පුරාවට වඩාත්ම දියුණු රටවල්හි පවා මෙකී නීතිපති දෙපාර්තමේන්තුව නම් වූ අයතනය සම්බන්ධයෙන් අවැසි ප්‍රතිසංස්කරණ පිළිබඳව අධ්‍යයනය කර ඇත. එවැනි සන්දර්භයක් තුළ, බ්‍රිතාන්‍ය පොදු නීති රටවල නීතිපති නම් වූ තනතුරවූ කලී ''වඩාත්ම දුෂ්කර නීතිඥයාගේ රැකියාව"[1] ලෙස හඳුන්වනු ලබන්නේ ය.

*විවිධ භූමිකාවන්:* නීතිපති දෙපාර්තමේන්තුව විවිධ කාර්යභාරයන් ඉටු කරනු ලබන අතර, මෙම වාර්තාවෙහි පෙන්වා ඇති පරිදි, එවන් වූ විවිධ කාර්ය කර්තව්‍යයන් යම් යම් අවස්ථාවල දී එකිනෙක අරමුණු හා ගැටෙන අතර එමගින් ගැටුම්කාරී තත්වයයන් ඇති වන අවස්ථාවන්ට මග පාදයි. මේ අන්දමින් වන පරස්පරතාවයන් නීතිපති කාර්යාලයට ආවේණික වන අතර, එකී තත්වයන් උද්ගත වන්නේ ද නීතිපතිවරයා විසින් ඉටු කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව නියම කර ඇති විවිධ කාර්යයන්හි ස්වභාවය හේතුවෙනි. මෙම වාර්තාව ඔස්සේ ඉස්මතු කරනු ලබන තර්කය වන්නේ, නීතිපතිවරයාට ස්වකීය තනතුරට අදාල රාජකාරි කාර්ය කර්තව්‍යන් අතර පවතින පිළිගැටුම් හා නොගැලපීමේ ස්වභාවයන් හේතුවෙන් එකී තනතුරෙන් අපේක්ෂිත සියලු රාජකාරි කටයුතු අපක්ෂපාතීව, ස්වාධීන හා කාර්යක්ෂම ආකාරයකින් ඉටුකළ නොහැකි බවය. නිදසුනක් වශයෙන්, රාජ්‍යය, රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු වල නීති නිලධාරියා වශයෙන් නීතිපතිවරයා විසින් කටයුතු කළයුතු බවට අපේක්ෂා කරන අතරම, සමහර අවස්ථාහි දී අධිකරණයෙහි දී නීතිපතිවරයා රජයේ නිල තනතුරු වල ප්‍රධාන නීතිඥවරයා වන අතර වගඋත්තරකරු වශයෙන් ද කටයුතු කරනු ලබයි. මීට අමතරව, යම් පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව පෙර අවස්ථාවක දී රජයට උපදෙස් දී තිබිය හැකි අතර පසු අවස්ථාවක දී එවන් පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය[2] තීරණය කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණ ක්‍රියා පටිපාටියෙහි දී ඒ සඳහා කරුණු දැක්වීමේ ව්‍යවස්ථානුකූල අයිතියක් නීතිපතිවරයාට ඇත.[3] නීතිපති කාර්යාලයේ මෙම අනන්‍ය වූ

[1] පවල්ස් ජී., "මෙතරම් සංකීර්ණ වන්නේ මන්ද: පැසිෆික් දූපත් ජනපදවල නීතිපතිගේ කාර්යභාරය සහ තත්වය සහ ටොංගා නඩුව" (2015) 21 තුළනාත්මක නීති සඳහා නවසීලන්ත සංගමය වාර්ෂික පොත 13

[2] ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 (1) වගන්තියේ මෙසේ සඳහන් වේ. "120, 96 [121, 125], 126, 129 (1) සහ 131."

[3] ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 වන වගන්තියේ මෙසේ සඳහන් වේ. "(1) 82 වන වගන්තියේ (1) සහ (2) ඡේදවල අවශ්‍යතාවන්ට පටහැනිව කටයුතු කිරීම සඳහා සෑම පනත් කෙටුම්පතක්ම විභාග කිරීම නීතිපතිවරයාගේ යුතුකම වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති විශේෂ බහුතරය හැර වලංගු නොවන ඕනෑම විධිවිධානයක්; සහ මෙම වගන්තිය යටතේ නීතිපතිවරයාට සිය රාජකාරි ඉටුකිරීමට සහාය වන ඕනෑම නිලධාරියෙකුට එම රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දිය යුතුය.

ද්විත්ව භූමිකාව හේතුවෙන් වසර ගණනාවක් තිස්සේ එකී ආයතනයෙහි කාර්යයන් දේශපාලනීකරණය වීමට හේතුපාදක වී ඇති සේම සහ සමස්ථයක් වශයෙන් එකී ආයතනයෙන් අපේක්ෂිත ස්වාධීන හා එකිනෙකට ගැළපෙන ආකාරයකින් එහි සියලු කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීමේ තත්වයක් ද උද්ගතවී ඇත. විවිධ කර්තව්‍යයන්හි කාර්යක්ෂමතාව සහ වැඩි පැහැදිලිකම සහ සුසංයෝගය සහතික කිරීම සඳහා නීතිපතිවරයා විසින් ඉටු කරනු ලබන බහුවිධ කාර්යභාරයන් වෙන් කොට නව කාර්යාලවලට නැවත පැවරිය හැකිය යන ස්ථාවරය මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි. තවද, නව වගවීමක් සඳහා වගකිව යුතු අතර එමඟින් ශක්තිමත් අධීක්ෂණයක් අවශ්‍ය වේය යන කාරණය ද මෙම වාර්තාව ඔස්සේ අවධාරණය කරනු ලබයි. අවසාන වශයෙන්, ප්‍රතිසංස්කරණයට ලක් වූ ආයතනයක ස්වරූපයෙන් පවතින තත්වයක දී, ඉතිරිව ඇති කාර්යයන් අපක්ෂපාතී හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ පවත්නා ආකෘතිය තුළ අවශ්‍ය වන්නා වූ ආයතනික ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් අවැසි නිර්දේශ මෙකී වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි.

නීතිපතිවරයාගේ කාර්යභාරයට ආවේණික වූ ද්විත්ව භූමිකාව සහ නීතිපති නම් වූ ආයතනික ව්‍යුහය දේශපාලනීකරණය වී ඇති ආකාරය වූ කලී බොහෝ රටවලිහි දීර්ඝ කාලීනව මතභේදයට තුඩු දී ඇති තත්වයකි. මේ ආකාරයෙන් වූ රටවල් බොහොමයක සිදු කරන ලද අධ්‍යයනවලින් නීතිපතිවරයාට තම රාජකාරි කටයුතු සතුටුදායක තත්වයකින් හා ස්ථාවරව ඉටු කිරීම සඳහා අනුගමනය කළ හැකි ආකෘති හෝ ආකල්පමය විකල්ප අවස්ථාවන් සම්බන්ධයෙන් යෝජනා කර ඇත.[4] බොහෝ විට, රාජ්‍ය නිලධාරියෙකු සහ විධායකයෙහි නීති උපදේශකයෙකු ලෙස නීතිපතිවරයෙකුගේ කාර්යභාරය සම්බන්ධයෙන් නීතිපතිවරයකුගේ 'බෙදුණු පක්ෂපාතීත්වය' සම්බන්ධයෙන් වෙනසක් පෙන්වා දෙනු ලැබේ.

*ප්‍රතිසංස්කරණ සඳහා අදහස්:* පළමුව, මෙම වාර්තාවෙහි නීතිපතිවරයා විසින් වර්තමානයෙහි ඉටු කරනු ලබන පහත දැක්වෙන කාර්යභාරයන් සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන අතර ඒ සෑම කාරණයක් පිළිබඳවම අදාල ව්‍යුහාත්මක සහ සංකල්පමය ගැටළු ඉස්මතු කරනු ලබයි.

- අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්යභාරය
- නීති පැනවීම කිරීමේදී ඉටු කළ කාර්යභාරය
- රජයේ නීති උපදේශක ලෙස කාර්යභාරය ඉටු කළේය

(2) 82 වන වගන්තියේ (1) සහ (2) ඡේදවල කිසියම් අවශ්‍යතාවයකට පනත් කෙටුම්පතක් උල්ලංඝනය වන බවට හෝ පනත් කෙටුම්පතක කිසියම් විධිවිධානයක් නියම කර ඇති විශේෂ බහුතරය හැර වලංගු නොවන බව නීතිපතිවරයාගේ මතය නම්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඔහු එවැනි මතයක් ජනාධිපතිවරයාට දැනුම් දිය යුතුය.
පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතකට යෝජනා කරන ලද සංශෝධනයක් සම්බන්ධයෙන්, පනත් කෙටුම්පත පිළිගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම් වන අවස්ථාවේ දී නීතිපතිවරයා තම මතය කථානායකවරයාට දැනුම් දිය යුතුය."

[4] ඩේලි ඩබ්ලිව්.ආර්., "නීතිපතිවරයාගේ සේවාදායකයා කවරෙක්ද" (2012) 87 නොට්‍රේ ඩේම් නීති සමාලෝචනය 1113; ස්පාල්ඩින් එන්.ඩබ්ලිව්., "නීතිපති කාර්යාලයේ වෘත්තීය ස්වාධීනත්වය" (2008) 60 ස්ටැන්ෆර්ඩ් නීති සමාලෝචනය 1931; ප්‍රකාශ් එස්., "ප්‍රධාන අභිචෝදක" (2005) සැන් ඩියාගෝ විශ්ව විද්‍යාලය මහජන නීතිය සහ නීති න්‍යාය පර්යේෂණ පත්‍රිකා මාලාව 30

ඉන් අනතුරුව, නීතිපති නම් වූ ආයතනයෙහි යම් යම් කාර්ය කර්තව්‍යයන්, විශේෂයෙන් නඩු පැවරීම සම්බන්ධයෙන් කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය ස්වාධීනත්වය සහ අපක්ෂපාතී බව මෙම වාර්තාව ඔස්සේ අවධාරණය කරනු ලබන අතර, මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා විකල්ප කාර්යාල, එනම් රජයේ අභිචෝදක කාර්යාලයක් සහ පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකයකක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරනු ලබයි.  කෙසේ වෙතත්, රජයේ සහ/හෝ විධායකයෙහි උපදේශකවරයාගේ කාර්යභාරය නීතිපතිවරයා විසින් වඩාත් හොඳින් ඉටු කරනු ලබන අතර එම නිසා ඔහුගේ කාර්යභාරයේ ඊට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සමඟ ඉදිරියටත් එලෙසම පවත්වාගෙන යනු ලබන්නේය යන ස්ථාවරය පවත්වාගෙන යනු ඇත.

වර්ෂ 2010 දී පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වල නීතිපති නම් වූ ආයතනය සඳහා ප්‍රතිසංස්කරණයන් ඉදිරිපත් කරන ලද වාර්තාවක් මඟින් එකී ආයතයන සම්බන්ධයෙන් වන තත්වය නිරීක්ෂණය කරන ලද අතර,

> *"මෙම "අනන්‍ය ආයතනය ආණ්ඩුව හා පාර්ලිමේන්තුව, අධිකරණය සහ විධායකය, ස්වාධීන නීතිඥයින් සහ රජයේ නඩු පවරන්නන්, රජය සහ පුරවැසියා යන දෙඅංශයන්හිම එකිනෙක හා සම්බන්ධිත ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි විහිදී සිටීම'' නම් වූ සාධකය පක්ෂග්‍රාහීත්වය සහ පක්ෂග්‍රාහීත්වය ඇති බවට විද්‍යමාන වීම සම්බන්ධයෙන් නිතර පැමිණිලි කිරීමට හේතු වී තිබෙන බව පොදුරාජ්‍ය මණ්ඩලීය ව්‍යවස්ථාවන්හි නීතිපති නම් ආයතනයෙහි ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා මෑතදී ගත් උත්සාහයන් සහ එක්සත් රාජධානියේ ප්‍රතිසංස්කරණ සඳහා වන වර්තමාන යෝජනා වලින් පිළිබිඹු වේ."*[5]

සේවක සංඛ්‍යාව, අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සහ පද්ධති සහ ආයතනික යටිතල පහසුකම් ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට සිදුකරනු ලබන ව්‍යුහාත්මක වෙනස්කම් අතර වෙනසක් කළ යුතුය. මෙම වාර්තාවෙහි අවධානය මූලික වශයෙන් වර්තමානයෙහි නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන ඇතැම් කාර්යයන් සඳහා විකල්ප ආයතනික ව්‍යුහයන් යෝජනා කිරීම තුළින් නීතිපති දෙපාර්තමේන්තුවේ ආයතනික සහයෝගීතාව වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු කෙරේ. ඒ කෙසේ ද යත්, නීතිපති දෙපාර්තමේන්තුවේ පවත්නා රාමුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර ව්‍යුහය අනුව වෙනස්කම් කිරීමේ අවශ්‍යතාවය වරින් වර පෙන්වා දී ඇත.[6] කෙසේ වෙතත්, මෙම වාර්තාවෙහි අවධානය යොමු වී ඇත්තේ පවත්නා නීතිපති දෙපාර්තමේන්තුව සංකල්පීය වශයෙන් වඩාත් සාධාරණ, විධිමත් සහ සුහදශීලී ආයතනයක් බවට පත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන අතර විශේෂිත කාර්ය කර්තව්‍යයන් සඳහා විකල්ප කාර්යාල හඳුන්වාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ද මෙමඟින් සිදු කොරේ.

---

[5] පවල්ස් ජී හි සඳහන් කර ඇති පරිදි, "මෙතරම් සංකීර්ණ වූයේ මන්ද: පැසිෆික් දූපත් ජනපදවල නීතිපතිගේ කාර්යභාරය සහ තත්වය සහ ටොංගා නඩුව" (2015) 21 සංසන්දනාත්මක නීති සඳහා නවසීලන්ත සංගමය 13, 13 පි. 17

[6] පින්ටෝ-ජයවර්ධන කේ., "නීතිය යුක්තිසහගත කිරීම: පසුගිය අවුරුදු 50 තුළ නීති වෘත්තියේ මහජන වගවීම" (2005) නීතිය හා සමාජ භාරය 'ශ්‍රී ලංකාවේ අවුරුදු 50 ක නීති යුක්තිය සහ පාලනය පිළිබඳ අපේක්ෂාවන්' p.152 https://lstlanka.org/wp-content/uploads/2017/11/Aspect-of-50-Years.pdf, ජනාධිපති නීතිඥ සාලිය පීරිස්. '' 'දෙපාර්තමේන්තුව' වටලනු ලැබේ; නීතිපතිගේ අනාගතය' '' (කොළඹ ටෙලිග්‍රාෆ්, 2015 ඔක්තෝබර් 25) https://www.colombotelegraph.com/index.php/the-department-under-siege-the-future-of-the-attorneygeneral/

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) විසින් ඉදිරිපත් කරන ලද මෙම වාර්තාව ඔස්සේ දශක ගණනාවක් පුරා පැවතිය හැකි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳව දැනුම්වත් කිරීමට අපේක්ෂා කරනු ලබන අතර එමගින් මෙම වාර්තාව හරහා විවිධ පාර්ශවකරුවන් අතර සාකච්ඡාවක් ආරම්භ කිරීමට අරමුණු කෙරේ. නීතිපතිවරයාගේ කාර්යභාරය වූ කලී (විශේෂයෙන් නඩු පැවරීම සම්බන්ධයෙන්) යුක්තිය පසිඳලීමේ පද්ධතියෙහි විශාල ව්‍යුහාත්මක පරාසයක් තුළ පවතින තත්වයක් බව පිළිගත යුතු අතර, එය අර්ථවත් හා ඵලදායී වීමට නම්, නීතිපති දෙපාර්තමේන්තුවේ ඕනෑම ප්‍රතිසංස්කරණයක් අධිකරණ අමාත්‍යාංශය සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන වැනි ආයතනයන් හි සිදුවන සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක අන්තර්ගත කොටසක් වශයෙන් සිදු විය යුතුය. වර්තමාන ආණ්ඩුව වර්ෂ 2020 පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන ලද්දේ වර්ෂ 2019 නොවැම්බර් මාසයෙහි පැවති ජනාධිපතිවරණය සඳහා ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති එම ප්‍රතිපත්ති මතම වන අතර ඒ තුළින් යුක්තිය පසිඳලීමේ ක්ෂේත්‍රයෙහි ප්‍රතිසංස්කරණ අවශ්‍ය බවට පෙන්වා දී තිබුණි.[7] එහි දී පෙන්වා දී තිබූ අනෙකුත් කරුණු අතර, "අනාගතයට ගැලපෙන නීති පද්ධතියක්"; "අධිකරණ අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය"; "යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් තුරන් කිරීමට පියවර ගත යුතුය"; "නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි හා යාන්ත්‍රණයන් හි කාර්යක්ෂමතාව වැඩි කිරීම"; " ප්‍රමාදයකින් තොරව නීතිය ක්‍රියාත්මක කරන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම" ආදී කරුණු වැදගත්කොට පෙන්වාදිය හැකිය.[8] මුලින්ම පෙන්වාදිය යුතු කරුණක් නම්, ඉහතින් සඳහන් කළ ප්‍රකාශයන් සුභදායී ලෙස පිළිගන්නා අතර, එවැනි ප්‍රකාශයන් ඉතා පුළුල් ඒවා වන අතර එවැනි පොරොන්දු කෙසේ සහ කවර කාල පරාසයක දී ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් අන්තර්ගත වී නොමැත. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නීතිපති ඇතුළු ප්‍රධාන ආයතන සඳහා පත්කිරීම් සිදු කිරීමේ දී ස්ථාපිතව පැවති අර්ථවත් සංවරණ ක්‍රමය ඉවත් කරන ලද බව ද මෙහි දී සඳහන් කළ යුතුය.[9] එවැනි සන්දර්භයක් තුළ, ස්වාධීන හා කාර්යක්ෂම යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ සමස්ත ඉලක්කය හා බැඳි ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී පරිශීලනය උදෙසා කේන්ද්‍රීය ලේඛණයක් වශයෙන් මෙම වාර්තාව භාවිත වීම මෙමගින් අදහස් කෙරේ.

---

[7] ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය, "රට හදන සෞභාග්‍යයේ දැක්ම" https://gota.lk/sri-lanka-podujana-peramuna-manifesto-english.pdf

[8] *ඉහත එම, පිටු.* 69 - 70

[9] 20 වන ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දක්වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එවකට පනත් කෙටුම්පතේ යෝජනා කර ඇති විධිවිධාන පිළිබඳ ප්‍රකාශයක් සහ විශ්ලේෂණයක් නිකුත් කළේය. වෙත ප්‍රවේශ විය හැකිය https://www.cpalanka.org/statement-on-thetwentieth-amendment-2/

## 2. ශ්‍රී ලංකාවේ නීතිපති ධූරයෙහි ඉතිහාසය

නීතිපති ධූරය ආරම්භයේ සිටම නීතිපතිවරයාට පවරා ඇති කාර්ය කාර්තව්‍යයන්, පත්වීම් හා ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටි සහ වාර්තාකරණ මෙන්ම අධීක්ෂණ යාන්ත්‍රණ ආදී කරුණු සමග විකාශනය වී ඇත. නීතිපතිවරයාගේ රාජකාරි ඉටු කිරීමේදී දේශපාලන මැදිහත්වීමේ තරම කෙරෙහි මෙම සාධක බෙහෙවින් බලපා ඇති අතර එමගින් එහි ස්වාධීනත්වයට සහ එහි ස්ථාවරය පිළිබඳ මහජනතාවගේ අවබෝධයට ද බලපෑමක් සිදු වී තිබේ.

මෙම ධූරයෙහි ආරම්භයේ සිටම නීතිපතිවරයා රජයට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග වලදී රජය නියෝජනය කරන 'රජයේ නීතිඥයා' ලෙස සලකන බව පැහැදිලිය.[10]

> *''වර්තමාන නීතිපතිවරයා වූ කලී පරම්පරානුගත මූල්‍ය අධිනීතිඥයා හෙවත් අද්වකාත් ගේ රේඛීය අනුප්‍රාප්තිකයා වන අතර, එකල මෙන්ම, රජයට එරෙහිව නීතිකෘත්‍යයන් සම්බන්ධයෙන් මූල්‍ය අධිනීතිඥයා හෙවත් අද්වකාත් ට එරෙහිව ගෙන එන ලද්දේ දේශීය 'මුදල්' හෝ භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන හෙයින් වන අතර, එබැවින් වර්තමානයෙහි එකී ක්‍රියාවන් නීතිපතිට එරෙහිව සිදු කරනු ලැබේ.''*[11]

වර්ෂ 1884 දී 'නීතිපති'[12] යන නිල නාමය විධිමත් ලෙස හඳුන්වා දෙන විට, එකී කාර්යාලය අභ්‍යන්තර කැබිනට් මණ්ඩලයේ කොටසක් විය. ඩොනමෝර් කොමිෂන් සභාවේ ප්‍රතිසංස්කරණ සඳහා වූ යෝජනා මගින්, නීතිපතිවරයා රජයේ සහ රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු වල උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම අපේක්ෂා කළ අතර එකී ධූරයට අමාත්‍යවරයකුගේ තත්වය භුක්ති විඳිමින් කටයුතු කිරීමට හැකි විය. වර්ෂ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නීතිපති කාර්යාලය දේශපාලන බැඳියාවෙන් ඉවත් කිරීමට කටයුතු කළ අතර සිවිල් හා අපරාධ නඩු වලදී රජය නියෝජනය කිරීමේ වගකීම නීතිපතිවරයාගේ ධූරයට පැවරීය.[13] කෙසේ වෙතත්, සෝල්බරි කොමිසම මගින්, නීතිපති නම් වූ ධූරයට ආවේනික වූ දේශපාලන සබැඳියාව පිළිගත් අතර, එය රජයේ ආයතනයක් බවත්, එමගින් සපයන උපදෙස් දේශපාලනික නොවන බවත් පෙන්වා දෙනු ලැබීය.[14] කෙසේ වුවද, 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඔස්සේ, නීතිපති නම් වූ ධූරයෙහි ස්වාධීනත්වය අඩු කිරීමට මග පෑදූ බව පෙනේ.[15] අසූව දශකයේ සිට නීතිපති නම් වූ ධූරය සම්බන්ධයෙන් වන දේශපාලන මැදිහත්වීම වැඩි වූ බව බොහෝ දෙනා පිළිගනිති.[16]

---

10 නීතිපති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය *බලන්න* <http://www.attorneygeneral.gov.lk/index.php/history>

11 ලෙ මිසුරියර් එදිරිව ලෙයාර්ඩ් නඩුවෙහි දී අගවිනිසුරු බොන්සර් ට අනුව, (1898) 3 නව නීති වාර්තා 227

12 මීට පෙර "මූල්‍ය අධිනීතිඥ", "රජුගේ අධිනීතිඥ" සහ "රැජිනගේ අධිනීතිඥ"

13 පින්ටෝ-ජයවර්ධන කේ., "නීතිය යුක්තිසහගත කිරීම: පසුගිය අවුරුදු 50 තුළ නීති වෘත්තියේ මහජන වගවීම" (2005) නීතිය හා සමාජ භාරය 'ශ්‍රී ලංකාවේ අවුරුදු 50 ක නීති යුක්තිය සහ පාලනය පිළිබඳ අපේක්ෂාවන්' p.152 https://lstlanka.org/wp-content/uploads/2017/11/Aspect-of-50-Years.pdf

14 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 සහ 34 බලන්න.

15 පින්ටෝ-ජයවර්ධන කේ., "නීතිය යුක්තිසහගත කිරීම: පසුගිය අවුරුදු 50 තුළ නීති වෘත්තියේ මහජන වගවීම" (2005) නීතිය හා සමාජ භාරය 'ශ්‍රී ලංකාවේ අවුරුදු 50 ක නීති යුක්තිය සහ පාලනය පිළිබඳ අපේක්ෂාවන්' p.152 https://lstlanka.org/wp-content/uploads/2017/11/Aspect-of-50-Years.pdf

16 *ඉහත එම* පි.154

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නීතිපතිවරයාගේ කාර්යභාරයේ නිශ්චිත ස්වභාවය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය තත්ත්වය පිළිබඳ නඩු තීන්දු ද්විත්වයක් ඔස්සේ පරිපූර්ණ ලෙස සාකච්ඡා කර ඇති අතර ඉන් එක් තීන්දුවක් අභියාචනාධිකරණය මඟින් සහ අනෙක් තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබා දී තිබේ.[17]

ආරම්භයේ සිටම නීතිපති නම් වූ ආයතනය හා බැඳි ඊටම ආවේණික වූ දේශපාලන අර්ථකථනයන්හි තත්වය පැහැදිලි වන අතර නීතිපති නම් වූ ආයතනය මඟින් දේශපාලන හේතූන් සම්බන්ධයෙන් පිළිබිඹු කරනු ලබන සලකාබැලීම් වලට ඇති සැබෑ පක්ෂග්‍රාහීත්වය හෝ පක්ෂග්‍රාහීත්වයක් ඇති බවට ඇති හැඟීම ඉවත් කිරීම දුෂ්කර කාර්යයකි. මෙම වාර්තාවෙහි පහත දැක්වෙන පරිච්ඡේදයන් ඔස්සේ, පරිපූර්ණ නොවන මුත්, නීතිපතිවරයාගේ විවිධ භූමිකාවන් සවිස්තරාත්මකව විශ්ලේෂණය කිරීම, ඒවා විවාදාත්මක තත්වයකට පත් වී ඇති ආකාරය සහ සුදුසු අවස්ථාවන්හි දී එවැනි ගැටළුකාරී තත්වයන් විසඳීම සඳහා අදාල නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

---

[17] *ඉහත එම පි.151*

*ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව එදිරිව ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ලිමිටඩ් (1981) 2 ශ්‍රී ලංකා නීති වාර්තා 147*

*ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව එදිරිව ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ලිමිටඩ් (1981) 1 ශ්‍රී ලංකා නීති වාර්තා 250*

ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේදී එය සමරකෝන් අගවිනිසුරු පෙන්වාදෙන ලද ආකාරයට

> *"නීතිපති යනු රාජ්‍යයේ සහ පසුව ස්වෛරීභාවයේ ප්‍රධාන නීති නිලධාරියා සහ උපදේශකයා වන අතර ඒ අර්ථයෙන් මහජනතාවගේ නිලධාරියෙකි. මේ රටේ නීතිපතිවරයා නීතිඥ නායකයා සහ රජයේ ඉහළම නීති නිලධාරියා ය. නීතිපති වශයෙන් ඔහුට අධිකරණයට, රාජ්‍යයට සහ විෂයයට මුළුමනින්ම බැඳී සිටිය යුතු, මුළුමනින්ම ස්වාධීන විය යුතු අතර සත්‍යය තහවුරු කිරීමේ එකම අරමුණ ඇතිව අපක්ෂපාතීව කටයුතු කළ යුතුය.*

## 3. නීතිපතිවරයා ප්‍රධාන අභිචෝදක වශයෙන්

නීතිපතිවරයා ජනරජයේ ප්‍රධාන අභිචෝදකවරයා වන අතර, පහත විස්තරාත්මකව සාකච්ඡා කර ඇති පරිදි, නඩු පැවරීම් ආරම්භ කිරීම, නඩු කටයුතු පවත්වාගෙන යාම සහ නඩු ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධයෙන් ස්වාධීන හා අවසානාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම කාරණාවලදී නීතිපතිවරයාගේ පුළුල් අභිමතය පරිදි ක්‍රියා කිරීමේ හැකියාව, ඔහුගේ ආයතනයෙහි ස්වභාවයට ආවේණික වූ දේශපාලන සබැඳියාව ද සමග ගත්කල, සත්‍ය වශයෙන් පවතින හෝ එසේ පවතිනවා යැයි මතයක් ඇති දේශපාලනීකරණය, ලැදියාවන් පිළිබඳ පිළිගැටුම සහ ඊට අමතරව, යුක්තිය පසිඳලීම පරිපාලනය කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු ආදී වශයෙන් වූ තත්වයන් ගණනාවක් උද්ගත කරනු ලබයි. මෙම පරිච්ඡේදය ඔස්සේ පළමුවෙන්ම, නීතිපතිවරයා විසින් ඉටු කරනු ලබන නඩු පැවරීමේ කාර්යභාරය සහ ඒ සම්බන්ධයෙන් ඔහුට ලබා දී ඇති පුළුල් අභිමතය සම්බන්ධයෙන් විමසා බලනු ලබයි. දෙවනුව, ඉතා කඩිනමින් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර වශයෙන් පවතින දේශපාලනීකරණය, ලැදියාවන් පිළිබඳ පිළිගැටුම සහ යුක්තිය පසිඳලීමට අදාළ කරුණු කිහිපයක් මෙම පරිච්ඡේදයෙන් විමසා බලනු ලබයි. අවසාන වශයෙන්, රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම සඳහා අවශ්‍යතාවයක් උද්ගතව ඇති බවට කරුණු ස්ථාපිත කරනු ලබන අතර, වර්තමානයේ නීතිපතිවරයාගේ නඩු පැවරීමේ කාර්යය සම්බන්ධයෙන් වර්තමානයෙහි පවතින අඩුපාඩු බොහොමයකට එමගින් පිළියම් කළ හැක්කේ කවර ආකාරයෙන් ද යන්න සාකච්ඡා කරනු ලබයි.

### 3.1. නීතිපතිවරයාගේ අභිචෝදක අභිමතය සහ අධිකරණ අධීක්ෂණය

**ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ ව්‍යවස්ථාපිත බලතල**

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 393 (1) වගන්තියේ සඳහන් වන්නේ නීතිපතිවරයා විසින් පහත සඳහන් අවස්ථාවන්හිදී තොරතුරු හා අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කිරීම සහ අපරාධ නඩු පැවරීම, භාර ගැනීම හෝ පවත්වා ගෙන යාම නීත්‍යානුකූල විය යුතුය යන්නයි: එනම්

අ) යම් වරදක් සම්බන්ධයෙන් XV වන පරිච්ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතුයයි නියමව ඇති,
ආ) වරද ඇප දිය නොහැකි වරදක් වන යම් අවස්ථාවක,
ඇ) රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නීතිපතිවරයා වෙත යොමු කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අපරාධ නඩු කටයුතු පැවරිය යුතු යයි නීතිපතිවරයා අදහස් කරන අවස්ථාවක
(ඈ) මෙම සංග්‍රහයේ 136 (1) (අ) වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නඩුවක් හැර වෙනත් අවස්ථාවක
(ඉ) නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍රයක් හෝ තොරතුරු ඉදිරිපත් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක ඕනෑම අවස්ථාවක.

තවද, 393 (2) වන වගන්තියේ සඳහන් වන්නේ, 'වැදගත් වන්නා වූ නැතහොත් දුෂ්කරතාවයකින් යුක්ත වූ යම් සාපරාධී කාරණයක දී රජයේ දෙපාර්තමේන්තුවලට, රාජ්‍ය නිලධාරීන්ට, පොලිස් නිලධරයන්ට සහ සංස්ථා නිලධරයන්ට, ඔවුන්ගේ ඉල්ලීම පිට හෝ නීතිපතිවරයාගේ වුවමනාවෙන් ම හෝ නීතිපතිවරයා විසින් උපදෙස් දිය යුතුය' යනුවෙනි.

අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන ප්‍රකාරව ගත්කල, අපරාධ කාරණා සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ ව්‍යවස්ථාපිත බලතල ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒවා පහත පරිදි පෙන්වා දෙනු ලැබිය හැකිය:

- "මහාධිකරණයේ නඩු විභාගයක් ජූරි සභාවක් මගින් හෝ වෙනත් ආකාරයකින් විය යුතුද යන්න තීරණය කිරීමේ බලය (1988 අංක 11 පනත මගින් සංශෝධිත 161 වගන්තිය); ලඝු ආකාරයෙහි වරදවල් සම්බන්ධයෙන් අධිචෝදනා පත්‍රයක් මහාධිකරණය වෙත සෘජුව ඉදිරිපත් කිරීමට හෝ මූලික පරීක්ෂණයක් පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයාට නියම කිරීමට ඇති බලය
- XV වන පරිච්ඡේදය (1980 අංක 52 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් 393 (7) වගන්තිය);
- ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චය කාරවරයන් තිදෙනෙකු විසින් විභාගයක් පැවැත්විය යුතු යම් වරදක් පිළිබඳව තොරතුරු නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි බවට අදාල බලය (1988 අංක 21 මගින් සංශෝධනය කරන ලද 450 (4) වගන්තිය සහ 393 වගන්තිය);
- ඇතැම් වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි ලබා දීමට බලය (135 (i) වගන්තිය); සැකයක් ඇති වුවහොත් නඩුවක් විභාග කිරීමට අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය තීරණය කිරීමේ බලය (135 වන වගන්තිය);
- නීතිපතිගේ අභිමතය පරිදි ලිඛිත නියෝගයක් මඟින් අපරාධ නඩු පැවරීමේ බලය එක් අධිකරණයකින් හෝ ස්ථානයකින් වෙනත් ස්ථානයක් වෙත මාරු කිරීමේ බලය (අධිකරණ සංවිධාන පනතේ 47 (i) වගන්තිය);
- 136 (i) (ඉ) වන වගන්තිය යටතේ ස්ථාපිත කර ඇති තනිකරම පෞද්ගලික නඩු හැරුණු විට වරදකරුවන්ට එරෙහිව මහාධිකරණවල සහ මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පැවරීමේ බලය (193 වගන්තිය, 191 (I) සහ 400 (I) වගන්තිය);
- අපසභයකයකුට සමාව දීමට බලය (256 (1) සහ 257 වගන්තිය);
- විභාග වෙමින් පවතින හෝ අවසන් වූ ඕනෑම නඩු කටයුත්තකට අදාලව ඕනෑම අවස්ථාවක මහාධිකරණයෙන් හෝ මහේස්ත්‍රාත් අධිකරණයෙන් වාර්තාවක් කැඳවීමේ බලය (398 (1) වගන්තිය);
- අවසන් කරන ලද ලඝු නොවන නඩු කටයුතු වලට අදාලව ඇති බලය (395 (1), 396 වගන්තිය, 399 වගන්තිය සහ 397 (1) වගන්තිය);
- නීතිපතිවරයා විසින් මහාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතු අවසන් කරමින් අපරාධ චෝදනාව අස්කර ගත හැකි වීමේ බලය (194 (I) වගන්තිය);
- මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් කරනු ලැබූ නිදොස් කොට නිදහස් කිරීමකට විරුද්ධව අභියාචනය කිරීමේ බලය (318 වගන්තිය);
- සියලුම අපරාධ අභියාචනා වලදී රජය වෙනුවෙන් පෙනී සිටීමට ඇති බලය (360 වගන්තිය); සහ
- විමර්ශන මෙහෙයවීමට සහ ඒවාට සහාය වීමට ඇති බලය."

විශේෂයෙන් නීතිමය කටයුතු සම්බන්ධයෙන් නීතිපති විසින් ක්‍රියාත්මක කරන ලද පුළුල් බලය සම්බන්ධයෙන් සී. ආර්. ද සිල්වා අනුස්මරණ දේශනයේදී හිටපු නීතිපති ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු විසින් පැහැදිලි කරන ලදි.[18] ඒ අනුව, අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සීමිත බලය හැරුණු විට, පුද්ගලයන්ට එරෙහිව අධිචෝදනා පත්‍ර නිකුත් කළ යුතුද නැද්ද යන්න තීරණය කිරීමේ එකම බලය නීතිපතිවරයාට ඇත. කිසියම් පුද්ගලයෙකුට එරෙහිව අධිචෝදනා ගොනු කරන ලෙස නීතිපතිවරයාට උපදෙස් දිය නොහැකි අතර එය ඔහුගේ අභිමතය පරිදි සිදු වේ. මේ සම්බන්ධයෙන් නීතිපතිවරයා 'අර්ධ-අධිකරණ' බලතල ක්‍රියාත්මක කරනු ලබන බව කියනු ලැබේ.[19] කිසිදු ආකාරයක බාහිර අගතියකින් හෝ බලපෑම් වලින් තොරව කරුණු සහ නීතිය පිළිබඳ ප්‍රවේශමෙන් හා විෂය මූලික විශ්ලේෂණයක් ඔස්සේ යම් චෝදනාවක් සම්බන්ධයෙන් පුද්ගලයෙකුට චෝදනා කිරීමට නීතිපතිවරයා විසින් තීරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.'[20]

අධිචෝදනා කිරීම සඳහා නීතිපතිවරයාට ඇති බලතල මූලික අයිතිවාසිකම් පෙත්සමක් මඟින් අභියෝගයට ලක් කර ඇත.[21] මෙය වික්ටර් අයිවන් එදිරිව. නීතිපති[22] නම් වූ නඩුවෙහි දී සිදු වූ අතර එහි දී විනිසුරු ප්‍රනාන්දු විසින් ප්‍රකාශ කරන ලද්දේ "කාරණා කීපයක් සම්බන්ධයෙන් නීතිපතිවරයාට ව්‍යවස්ථාපිත අභිමතයක් ඇති බව පැහැදිලිය. කොන්සේදි ඉදිරිපත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ ලඝු ආකාරයෙහි නඩු විභාගයක් බැහැර කළ යුතුද යන්න සහ එවන් අවස්ථාවන්හි දී, ලඝු නොවන නඩු විභාග කිරීමට හෝ අධිචෝදනා පත්‍රයක් ගොනු කළ යුතුද යන්න ඔහු විසින් තීරණය කළ යුතුය. එම අභිමතය පරිදි ක්‍රියාත්මක කිරීම ව්‍යවස්ථාදායක හෝ අධිකරණමය ක්‍රියාවක් නොවන අතර එය 'විධායක හෝ පරිපාලනමය ක්‍රියාමාර්ගයක්' වේ.[23] විනිසුරු ප්‍රනාන්දු විසින් තවදුරටත් ප්‍රකාශ කර සිටියේ නීතිපතිවරයාට අධිචෝදනා පත්‍රයක් ගොනු කිරීමට හෝ ගොනු කිරීමට ඇති බලය ''පරම හෝ නිර්බාධිත'' බලයක් නොවන බවයි. එය මහජන ක්‍රියාකාරීන් තුළ නීතියෙන් පවරා ඇති වෙනත් බලතල වලට සමානය. එකී අභිමත බලතල මහජනතාව කෙරෙහි භාරයක් වශයෙන් තබා ඇති අතර, ඒවා ප්‍රදානය කර ඇති අරමුණු සඳහා පමණක් යොදා ගත යුතු අතර වෙනත් ආකාරයකට භාවිත නොකළ යුතුය. එවැනි බලයක් හෝ අභිමතයක් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වන පරිදි ක්‍රියාත්මක වන විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය යටතේ සමාලෝචනය කළ හැකිය" යනුවෙන් පෙන්වා දෙන ලදි.[24]

නීතිපතිවරයා සතු අනෙක් අනන්‍ය බලය වන්නේ සැකකරුවෙකු සම්බන්ධයෙන් මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන අපරාධ නඩු විභාග කටයුත්තක් අත්හිටුවීමට (nolle prosequi) තීරණය කිරීමේ

18 හිටපු නීතිපති පාලිත ප්‍රනාන්දු පී.සී. "ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ කාර්යභාරය සහ නීතියේ ආධිපත්‍යය; අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ විශේෂ සඳහනක් සහිතව", (2016) දිවංගත සී. ආර්. ද සිල්වා මහතාගේ 3 වන මරණ සංවත්සරයේදී ඉදිරිපත් කරන ලදි. http://www.sundaytimes.lk/161113/palitha_orations.pdf

19 ඉහත එම

20 ඉහත එම

21 හිටපු නීතිපති පාලිත ප්‍රනාන්දු පී.සී. "ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ කාර්යභාරය සහ නීතියේ ආධිපත්‍යය; අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ විශේෂ සඳහනක් සහිතව", (2016) දිවංගත සී. ආර්. ද සිල්වා මහතාගේ 3 වන මරණ සංවත්සරයේදී ඉදිරිපත් කරන ලදි. http://www.sundaytimes.lk/161113/palitha_orations.pdf

22 1998 1 ශ්‍රී ලංකා නීති වාර්තා 340

23 ඉහත එම 343 පිටුව

24 ඉහත එම 346 පිටුව

හැකියාවයි. මෙය නීතිපතිවරයා විසින් පමණක් භුක්ති විඳිය හැකි අන්දමේ බලය පවරන ලද තත්වයක් වන අතර, අධිචෝදනා පත්‍රයක් ඉල්ලා අස්කර ගැනීමට පැමිණිල්ලේ නිලධාරියෙකුට ඇති අයිතිය සමඟ එය ව්‍යාකූල කර නොගත යුතුය.[25] අධිකරණයේ අවසරයකින් තොරව සහ නඩු පැවරීම අත්හිටුවීමට කිසිදු හේතු දැක්වීමක් ඉදිරිපත් නොකර අපරාධ නඩු විභාගයක් අත්හිටුවීම සඳහා නීතිපතිවරයාට තීරණය කළ හැකි එකම ක්‍රමය එයයි. නීතිපතිවරයාගේ මතය අනුව, චූදිතයාට එරෙහි කරුණු අනුව අපරාධ නඩු පැවරීම යුක්ති සහගත වුවද, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන අපරාධ නඩු විභාග කටයුත්තක් අත්හිටුවීමට (nolle prosequi) ඇති විධිවිධානය ප්‍රතිපත්තිමය කාරණයක් ලෙස ඇතුළත් කර ඇත.[26] ගුරියට් එදිරිව. තැපැල් කාර්යාල සේවකයින්ගේ සංගමය නඩුවේ දී වංශාධිපති ඩිල්හෝර්න්[27] විසින් ප්‍රකාශ කරන ලද්දේ "අධිචෝදනා පත්‍රයක් සම්බන්ධයෙන් නඩු පැවරීම නතර කිරීමේ හැකියාව පැවැත්වෙන අපරාධ නඩු විභාග කටයුත්තක් අත්හිටුවීමට (nolle prosequi) ඇති විධිවිධානය යටතේ නීතිපතිවරයාට ඇති බවයි. ඔහුට ඇත්තේ නඩු විභාගය දිගටම පවත්වාගෙන යාමට තමා කැමති නැති බව පවසමින් කඩදාසි කැබැල්ලකට අත්සන් කිරීම පමණය. ඔහු ඒ සඳහා කිසිදු හේතු දැක්වීමක් සිදුකිරීමට අවශ්‍ය වන්නේ නැත. ඔහුට අපරාධ නඩු පැවරීමේ ආයතනය මෙහෙයවිය හැකි අතර ඕනෑම අපරාධ නඩු විභාගයක් පවරා ගන්නා ලෙස රජයේ නඩු අධ්‍යක්ෂවරයාට නියම කළ හැකි අතර කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකරන ලෙස ඔහුට විධාන කළ හැකිය. මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී ඔහු තම අමාත්‍ය සගයන්ගේ උපදේශයන්ට හෝ අධිකරණ පාලනය හා අධීක්ෂණයට යටත් නොවේ."[28]

ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ බලතල වලට සමාන තත්වයක් පවතින ඊශ්‍රායලයේ, නඩු පැවරීම නොකර සිටීමට නීතිපතිවරයාට තීරණය කිරීමට හැකි අධිකරණමය මැදිහත් වීමක් සිදු කරනු ලබන්නේ, එවැනි තීරණයක් පැහැදිලි වශයෙන්ම මහජනතාවගේ යහපතට හා අසද්භාවයෙන් සිදුව ඇති විට පමණි.[29] සෝර්ෆාන් සහ වෙනත් අය එදිරිව හමුදා ප්‍රධානී නීතිඥ[30] සහ වෙනත් අය සහ ගනෝර් සහ වෙනත් අය එදිරිව නීතිපති සහ වෙනත් අය[31] යන නඩු කටයුතු ද්විත්වයෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීතිපතිවරයා විසින් නඩු නොපැවරීමට ගත් තීරණය ආපසු හරවා මුල් අවස්ථාවේදීම නඩු පැවරීම ආරම්භ කරන ලෙස නියෝග කොට නඩුව නැවත සමාලෝචනය සඳහා නීතිපති වෙත යොමු කරන ලෙසට නියෝග කරන ලදී.[32]

---

[25] හිටපු නීතිපති ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු "ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ කාර්යභාරය සහ නීතියේ ආධිපත්‍යය; අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ විශේෂ සඳහනක් සහිතව", (2016) දිවංගත සී. ආර්. ද සිල්වා මහතාගේ 3 වන මරණ සංවත්සරයේදී ඉදිරිපත් කරන ලදී. http://www.sundaytimes.lk/161113/palitha_orations.pdf

[26] ඉහත එම

[27] හවුස් ඔෆ් ලෝඩ්ස් (1978) 453 දී

[28] පින්ටෝ-ජයවර්ධන, කේ. (2005) 'නීතිපතිවරයාගේ මහජන වගවීම-ඔහුගේ ව්‍යවස්ථාපිත බලතල අභ්‍යාසය අධිකරණය විසින් සමාලෝචනය කළ යුත්තේ කොපමණ ප්‍රමාණයකටද?' පිටුව.47 නීතිය හා සමාජ භාරයෙහි සමාලෝචනය, වෙළුම 15, නිකුතුව-211.

[29] ඉහත එම

[30] (1990) 43 (3) පී.ඩී. 718

[31] (1990) 44 (2) පී.ඩී. 485

[32] ඉහත එම

වික්ටර් අයිවන් එදිරිව. සරත් එන්. සිල්වා[33] නඩුවේදී, නඩු පැවරීම නොකර සිටීමට නීතිපතිවරයාට තීරණය කිරීමේ හැකියාව සමාලෝචනය කළ හැකිද යන ප්‍රශ්නයට පිළිතුරු සපයන ලදි.[34] එසේ නඩු නොපවරා සිටීම සඳහා නීතිපතිවරයාට ඇති බලය සමාලෝචනය කිරීමේ බලයක් පැවතිය හැකි වන්නේ, නිදසුනක් වශයෙන්, සාක්ෂි පැහැදිලිවම ප්‍රමාණවත් නොවූ, විමර්ශනයක් සිදු නොවූ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව අනුමත කළ නොහැකි සාධක මත තීරණය ගෙන ඇති තත්වයන්හි දී පමණක් බවට පෙන්වා දෙන ලදි.[35]

රජයට එරෙහිව නඩු පැවරීම හා ඒ හා සමගාමීවම රජය ආරක්ෂා කිරීම යන ද්විත්ව භූමිකාවෙහි දී නීතිපතිවරයාගේ කාර්යභාරය 1969 තරම් ඈත අතීතයේ දී පවා සාකච්ඡාවට භාජනය වී ඇත. ''නීතිපතිවරයාගේ කාර්යාලය" නම් වූ ග්‍රන්තයෙහි දී ශ්‍රීමත් එල්වින් ජෝන්ස් නිරීක්ෂණය කරමින් පෙන්වා දී ඇත්තේ නීතිපතිවරයා කොතරම් දේශපාලනික ප්‍රාණියකු වුවද දේශපාලන කාරණා සමග කටයුතු කිරීමේදී, අපක්ෂපාතීව හා අර්ධ අධිකරණමය ආකාරයකින් පවා ක්‍රියා කළ යුතු කාරණා සම්බන්ධයෙන් ඔහුගේ ක්‍රියාමාර්ග කෙරෙහි බලපෑම් කිරීමට දේශපාලන බලපෑම්වලට ඉඩ නොදිය යුතුය යනුවෙනි.[36] ශ්‍රී ලංකාව ද නීතිපතිවරයාගේ කාර්යභාරයේ 'දෙමුහුන්' ස්වභාවය උරුම කරගෙන ඇති අතර, එබැවින්, නීතිපතිවරයා ඔහුගේ හෝ ඇයගේ තීරණ ගැනීමේදී එහි ස්වභාවය පිළිබඳව අධිකරණය විසින් ප්‍රශ්න කළ නොහැකි අන්දමේ පරම අභිමතයක් සහිතව කටයුතු කළ යුතුද යන ප්‍රශ්නය මෙරට සන්දර්භයට ද අදාළ වේ.

## 3.2. නීතිපති කාර්යාලයෙහි දේශපාලනීකරණය වීම සහ රාජකාරි ඉටු කිරීමේදී දේශපාලන මැදිහත්වීම්

නීතිපතිවරයාගේ කාර්යභාරයෙහි වැදගත්කම සැලකිල්ලට ගැනීමේ දී, එකී ආයතනය සැබවින්ම ක්‍රියාත්මක වන්නේ සේශපාලනීකරණයකින් තොරව සහ ස්වාධීනව පමණක් නොව එය එලෙස ක්‍රියාත්මක වන බව විද්‍යමාන වීම ද වැදගත් ය. මෙම වාර්තාව පුරාම ඉස්මතු කර පෙන්වා දී ඇති පරිදි, නීතිපතිවරයාට ව්‍යවස්ථානුකූලව පැවරී ඇත්තේ එකිනෙකා සමග වෙනස් වන භූමිකාවන් ඉටු කිරීම ය. මෙම පරස්පර විරෝධී කාර්යයන් සිදු කිරීම සම්බන්ධයෙන් ගත් කළ නීතිපතිවරයාට ලබා දී ඇති පුළුල් අභිමතානුසාරී බලය සලකා බැලීමේදී, එමගින් සෑම තීරණයක්ම ගැනීමේ දී දේශපාලන සලකා බැලීම් වලින් තොරව ස්වාධීනව ක්‍රියා කරනු ලැබුවේ ද යන්න තීරණය කිරීම සඳහා විෂය මූලික යාන්ත්‍රණයක් භාවිතා නොකෙරෙන පසුබිමක් තුළ මෙය විශේෂ වැදගත්කමක් උසුලයි. පවත්නා රාමුව යටතේ නීතිපතිවරයා දේශපාලන ක්‍රියාකාරීන් සමග නිරන්තර සම්බන්ධතා පවත්වන සන්දර්භයක් තුළ, එකී ආයතනයෙහි ක්‍රියාකාරීත්වය සෑම විටම එහි ප්‍රධාන තනතුර හොබවන පුද්ගලයන්ගේ චරිතයෙහි ස්වභාවය හෝ සුපිළිපන්නතාවය පිළිබඳව තත්වය කවරක් වුව ද එකී ආයතනයෙහි දේශපාලන පක්ෂග්‍රාහීත්වය පිළිබඳ විවේචන සඳහා එය නිරන්තරයෙන් විවෘත වේ. මේ අනුව, නීතිපති කාර්යාලයේ තීරණාත්මක කාර්යභාරය සහ පක්ෂග්‍රාහී විය හැකි තත්වයන් සහ යමෙකු

[33] (1998) 1 ශ්‍රී ලංකා නීති වාර්තා 340

[34] පින්ටෝ-ජයවර්ධන, කේ., "නීතිපතිවරයාගේ මහජන වගවීම - ඔහුගේ ව්‍යවස්ථාපිත බලතල අභ්‍යාසය අධිකරණය විසින් සමාලෝචනය කළ යුත්තේ කොපමණ දුරටද?" (2005) 15 නීතිය හා සමාජ භාර සමාලෝචනය 50

[35] ඉහත එම 51 පිටුව

[36] ඉහත එම 42 පිටුව

නොකළ වරදකට වරදකරු වීමේ හැකියාව උද්ගත විය හැකි කරුණු බොහොමයක් මෙම වාර්තාවෙහි දක්වා ඇති අතර මෙම ආයතනය සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අතවශ්‍ය තත්වයට පිළියම් යෙදීමේ දී එවන් වූ සියලු සාධක සැලකිල්ලට ගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

පවතින ආණ්ඩු විසින් අධිකරණ පද්ධතියට බලපෑම් ඇති කිරීමේ මාධ්‍යයක් වශයෙන් නීතිපති දෙපාර්තමේන්තුව බොහෝ කලක සිට පවතින බවට සැලකේ. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුව විධායකයේ ඍජු පාලනය යටතේ ක්‍රියාත්මක වීමයි. වර්ෂ 2005 සිට 2015 දක්වා වූ කාල පරාසය තුළ නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපති ලේකම් කාර්යාලයේ විෂය පථය[37] යටතට ගන්නා ලද අතර, එකී වකවානුව තුළ මෙම දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය සහ වධහිංසා පැමිණවීම් හා හිංසා පීඩා සම්බන්ධ මූලික අයිතිවාසිකම් අයදුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ වගඋත්තරකරුවන් වූ නිලධාරීන්ට පෙනී නොසිටීම වැනි ඓතිහාසික සාම්ප්‍රදායික ප්‍රතිපත්ති බොහොමයක් අතහැර දමා ඇත.[38] මෙම තත්වය හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වයට හා ඒ කෙරෙහි මහජනතාව තුළ දැඩි බලපෑමක් උද්ගත කර ඇත.[39]

පත්වීම් සිදු කිරීමේ ක්‍රියාපටිපාටිය තුළ විනිවිද පෙනෙන ක්‍රියාවලියක් අනුගමනය නොකරන්නේ නම් නීතිපතිවරයාගේ පත්වීම වූ කලී ලැදියාවන්හි පිළිගැටුම් සම්බන්ධයෙන් වන ගැටළු රැසකට තුඩු දිය හැකිය. ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් මහතාව නීතිපති සහ පසුව අගවිනිසුරු ලෙස පත් කිරීමත් සමඟ මෙය පැහැදිලි වූ අතර එහි දී ඔහු පෙර කී තනතුරු දරන අතරම අමාත්‍ය මණ්ඩලයේ නීති උපදේශක ලෙස ද කටයුතු කළ අතර, එමගින් එකී තත්වය විශාල වශයෙන් සිවිල් සමාජයේ උදහසට ලක් විය.[40] අර්ථවත් සංවරණ ක්‍රමවේදයක් හෝ උපදේශනයක් නොමැතිව ප්‍රධාන ආයතනවලට පත්වීම් ලබා දීමට ජනාධිපතිවරයාට පුළුල් බලයක් සපයන 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මෑතකදී බලාත්මක කිරීමත් සමඟ මෙම ආයතන සඳහා කෙරෙන අනාගත පත්වීම් සම්බන්ධයෙන් බරපතල ගැටළු මතු වේ.

වධහිංසා පැමිණවීම හෝ වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත ලෙස සැලකීම හෝ දඬුවම් කිරීම සම්බන්ධයෙන් විශේෂ වාර්තාකරු ජුවාන් ඊ. මෙන්ඩෙස් (Juan E. Mendez) වර්ෂ 2016 දී සිදුකල ස්වකීය ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධයෙන් වන වාර්තාවේ, අපරාධකරුවන්ට අධිචෝදනා ඉදිරිපත් කළ යුතුද යන්න තීරණය කිරීම සඳහා නීතිපතිවරයාට ලබා දී ඇති අභිමතානුසාරී බලය වූ කලී පවතින පද්ධතියෙහි දුර්වලතාවයක් බවට පෙන්වා දී ඇති අතර වධහිංසාවට එරෙහි සම්මුතිය යටතේ නීතිපති විසින් අධිචෝදනා ගණනාවක් ගොනු කරනු ලැබුවද, ඒ සම්බන්ධයෙන් දඬුවම් නියම කර

37 'නීතිපති දෙපාර්තමේන්තුව බරපතල මහජන පරීක්ෂාවට ලක් වේ' (කොළඹ ටෙලිග්‍රාෆ්, 2016 මැයි 23) https://www.colombotelegraph.com/index.php/attorney-generals-department-comes-under-serious-publicscrutiny/

38 ඉහත එම

39 ප්‍රනාන්දු, බී. (2016) 'ශ්‍රී ලංකාව / ලෝක - නීතිපති දෙපාර්තමේන්තුව දැඩි මහජන පරීක්ෂාවට ලක් වේ' (ආසියානු මානව හිමිකම් කොමිසම) http://www.ahrchk.org/ruleoflawasia.net/news.php?id=AHRC-FAT-0232016

40 SC / FR / 578/2008 හි ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් අයදුම්පතක් මගින් නීතිපති ලෙස මොහාන් පීරිස් පත් කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අභියෝගයට ලක් කළේය (බලන්න https://www.cpalanka.org/the-centre-forpolicy-alternatives-vs-attorney-general-sc-fr-5782008/ ), පසුව SC / FR / 23/2013 හි අගවිනිසුරු ලෙස (බලන්න https://www.cpalanka.org/centre-for-policy-alternatives-and-another-vs-d-m-jayaratne-and-others-sc-fr232013/)
'මොහාන් පීරිස් නව නීතිපති' (සන්ඩේ ටයිම්ස්, 2008 දෙසැම්බර් 21)
http://www.sundaytimes.lk/081221/News/sundaytimesnews_05.html

ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකටය.[41] කෙසේ නමුත්, ඇතැම් නඩු පවරන්නන්ගේ දැඩි කැපවීම හේතුවෙන් පද්ධතිය තුළ යම් යම් සාධනීය ක්‍රියාත්මකභාවයක් ද දැකිය හැකි අතර ඒ අනුව යම් ප්‍රගතියක් සිදුවී ඇති බව ද සැලකිල්ලට ගත යුතුය. එම තත්වය සඳහා සුවිශේෂී උදාහරණයක් වනුයේ ක්‍රිෂාන්ති කුමාරස්වාමිගේ නඩු කටයුත්තය.[42]

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලීසිය සහ අධිකරණය වැනි ආයතන සම්බන්ධයෙන් ස්වාධීන මට්ටමක් ස්ථාපිත කිරීමට උත්සාහ කළද, අපරාධ නඩු කිහිපයක්[43] මඟින්ම සාක්ෂි දරන ආකාරයට සමස්තයක් වශයෙන් විමර්ශන ක්‍රියාවලීන් සඳහා දේශපාලන මැදිහත්වීම සිදු වීමේ තත්වය කවර ලෙසකට හෝ බැහැර කළ නොහැකිය. විමර්ශන නිලධාරීන්[44] හෝ අධිචෝදනා ගොනු කරනු ලබන නිලධාරීන්[45] මාරු කිරීම ආදී ක්‍රියාවන් මඟින් එවැනි දේශපාලනික මැදිහත්වීම් විය හැකිය. මෙය සමස්තයක් වශයෙන් අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ප්‍රධාන අඩුපාඩුවක් ලෙස දැකිය හැකිය.

දේශපාලනික වශයෙන් සංවේදී කාරණා සම්බන්ධයෙන් නඩු පැවරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ කාර්යභාරය මෑත වසරවලදී ප්‍රමාණවත් තරම් නිසි පරිදි සිදු වී නොමැති බව සොයාගෙන ඇත. නිදසුනක් වශයෙන් ගත් කල, අළුත්ගම කෝලාහලයට තුඩුදුන් හා ඉන් පසුව ඇති වූ සිදුවීම්, නීතිපතිවරයාගේ ප්‍රමාදයන් පිළිබඳ අවාසනාවන්ත තත්වයක් පෙන්නුම් කෙරෙන සිදුවීමකට උදාහරණයක් වන අතර එහිදී අවශ්‍ය නම් එකී තත්වයට පත් වීමට පෙර නිසි පියවර ගෙන එය වැලැක්වීමේ හැකියාව වුවද පැවතිය හැකිව තිබුණි. වර්ෂ 2014 දී අළුත්ගම ප්‍රදේශයෙ හි ඇති වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට පෙර, එවකට ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින්, එවක සිටි නීතිපති වෙත ලිපියක් යොමු කරමින්, බොදු බල සේනාවට එරෙහිව මුස්ලිම් විරෝධී හැඟීම් සක්‍රීයව ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියේය.[46] එකී ප්‍රචණ්ඩත්වයෙන් ඉක්බිතිව, පුද්ගල හා දේපළ හානි සම්බන්ධයෙන් නීති උපදෙස් හා සහාය අවශ්‍ය වූ අතර එකී අභියෝගය නිසි පරිදි ආමන්ත්‍රණය කිරීමට නීතිපතිවරයා අපොහොසත් විය.[47]

කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ අන්දමේ සිදුවීම්, මිරුසුවිල් සංහාරයේ සුනිල් රත්නායක වරදකරු කිරීම හා පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ දී වරද තහවුරු කිරීමත් සමඟ නීතිපති දෙපාර්තමේන්තුව ඉටු කළ

---

41 මානව හිමිකම් කවුන්සිලය (2016) 'ශ්‍රී ලංකාවට ඔහු කළ මෙහෙවරට වධහිංසා පැමිණවීම හෝ වෙනත් කුරිරු අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව' p.15
https://www.mfa.gov.lk/wpcontent/uploads/2018/03/34-5.pdf

42 *සෝමරත්න රාජපක්ෂ මහතා සහ වෙනත් අය එදිරිව. ගරු නීතිපති 2010 2* ශ්‍රී ලංකා නීති වාර්තා *113*
http://www.lawlanka.com/lal/slrDetailReportView?caseId=2010SLR2V113&searchPage=true

43 වැඩි විස්තර සඳහා, ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය බලන්නඃ සංකේතාත්මක සිද්ධීන් හතක් දෙස බැලීම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2019 මාර්තු https://www.cpalanka.org/wpcontent/uploads/2019/03/FINAL-A-Glance-at-Seven-Emblematic-cases-.pdf

44 "අපරාධ විමර්ෂණ කොට්ඨාශයෙහි පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාගේ සේවා ස්ථාන මාරු කිරීම" (ඩේලි මිරර්, 2018 නොවැම්බර් 19) වෙත ප්‍රවේශ විය හැකිය http://www.dailymirror.lk/article/CID-s-IP-Nishantha-Silva-transferred-158572.html

45 එක්නැලිගොඩ නඩුව පිළිබඳ ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයකු "මාරු කිරීම" පිළිබඳ ව්‍යාකූලතාව"(ඩේලිඑෆ්ටී, 2016 පෙබරවාරි 9)
http://www.ft.lk/article/524035/Confusion-over-%E2%80%9Ctransfer%E2%80%9D-of-Senior-State-Counsel-on-Eknaligoda-case

46 හනීෆා එෆ්., අමරසූරියා එච්., විජේනායක වී., ගුණතිලක ජී., "සියලු අසල්වැසියන් ගොස් ඇත්තේ කොහේද? අළුත්ගම කෝලාහල සහ එහි ප්‍රතිඵල"(2014, නීතිය හා සමාජ භාරය), පි. 13 ට ප්‍රවේශ විය හැකිය
https://lstlanka.org/wpcontent/uploads/2017/11/aluthgama-report-final-english.pdf

47 ඉහත එම 67 පිටුව

ධනාත්මක කාර්යභාරය වැනි සාධනීය තත්වයන් සමඟ බැලීමේ දී වෙනස් විය හැකිය.[48] සාර්ථක නඩු පැවරීම් පිළිබඳ එවැනි උදාහරණ දුර්ලභ වන අතර, මෙම වාර්තාවෙහි යෝජනා කර ඇති පරිදි ප්‍රතිසංස්කරණ මගින් වඩාත් අවධානය යොමු කළ නඩු පැවරීමේ උපාය මාර්ගයකට මඟ පෑදිය හැකිද යන ප්‍රශ්නය මතු වේ.

නීතිපති කාර්යාලයට පවරා ඇති නඩු පැවරීම සම්බන්ධයෙන් වන පුළුල් අභිමතය වූ කලී එකී ආයතනයෙහි පවතින සමීප දේශපාලන සබැඳියාවේ ස්වභාවය හේතුවෙන් පහසුවෙන් දේශපාලන මැදිහත්වීම් වලට භාජනය වීමේ ඉඩ ප්‍රස්ථාව තිබිය හැකිය. මෙකී තත්වය සැලකිල්ලට ගනිමින් කලින් තීරණය කළ සහ ස්ථාපිත කරන ලද නිර්ණායකයන්ට යටත්ව එවැනි අභිමතය බලයක් නිශ්චිත වශයෙන් ව්‍යුහගත කර ක්‍රියාත්මක කළ යුතු යැයි යෝජනා කරනු ලැබේ. නඩු පැවරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ අභිමතය එකී ආයතනය, පවත්වාගෙන යාම සහ නඩු කටයුතු ඉල්ලා අස්කර ගැනීම ආදී කරුණු සම්බන්ධයෙන් පැහැදිලිව ස්ථාපිත මාර්ගෝපදේශ මගින් ව්‍යුහගත කිරීම, ප්‍රධාන වශයෙන් දේශපාලන මැදිහත්වීම් සහ යුක්තිය පසිඳලීමට අදාළ ගැටළු ද ඇතුළුව මෙම වාර්තාවේ දක්වා ඇති බොහෝ කරුණු, විසඳීම සඳහා හේතු පාදක විය හැකිය. එක්සත් රාජධානියේ රජුගේ නඩු පැවරීමේ සේවය මඟින්, පොලීසිය සහ වෙනත් විමර්ශන යාන්ත්‍රණයන් විසින් විමර්ශනය කර ඇති සිද්ධීන් පිළිබඳව සොයා බලන අතර, පොලීසියෙන් සහ රජයෙන් ස්වාධීනව පවතී. එය ක්‍රියාත්මක වන්නේ නඩු පැවරීමට අදාළ අධිචෝදනා ගොනු කිරීමට අදාලව විවිධාකාර කරුණු පිළිබඳ සවිස්තරාත්මක මාර්ගෝපදේශ ස්ථාපිත කිරීමෙන් වන අතර එහිදී ''රජුගේ අභිචෝදකයන් සඳහා වන සංග්‍රහය'' (“Code for Crown Prosecutors”)[49] තුළ එවන් වූ මාර්ගෝපදේශ බොහොමයක් ඇත. මෙකී මාර්ගෝපදේශයන් ඔස්සේ ස්වාධීනත්වය සහ සාධාරණත්වය කෙරෙහි අවධානය යොමු කරමින් විෂය මූලික නිර්ණායක සැපයීමට උත්සාහ කරයි. නිදර්ශනයක් වශයෙන්, රජු විසින් අපරාධ නඩු පැවරීම සඳහා එකී සංග්‍රහය මඟින් පෙන්වා දෙනු ලබන ආකාරයට "පූර්ණ පරීක්ෂණය" (“Full Code Test”) හෝ විකල්පයක් වශයෙන් "අවම පරීක්ෂණය" (“Threshold Test”) නියම කරනු ලබයි. එම සේවයෙහි ස්වාධීනත්වය හා අපක්ෂපාතී බව සහතික කරමින් නඩු බැහැර කිරීමේ ආකාරය සහ නිර්ණායක පැහැදිලිව හඳුනාගෙන නිර්වචනය කර ඇත.

ඕනෑම රාජ්‍ය ආයතනයක් දේශපාලනීකරණය විය හැකි මූලික ක්‍රමයක් වන්නේ අදාල ආයතන ප්‍රධානී තනතුර දරනු ලබන තැනැත්තාව එකී ධූරයට පත් කිරීම සිදු කරන සහ ධූරයෙන් ඉවත් කරන ආකාරයයි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර, ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් නීතිපතිවරයා පත් කරන ලද[50] අතර එය 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඉවත් කර ඇති අතර ඒ වෙනුවට ස්වාධීනත්වයෙන් අඩු පාර්ලිමේන්තු සභාවක්

[48] https://www.cpalanka.org/the-pardon-in-the-mirusuvil-massacre-sri-lankas-elusive-quest-for-justice/.
2020 අප්‍රේල් මාසයේදී රත්නායකට ජනාධිපති සමාවක් ලැබුණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ සමාව සඳහා කිහිප දෙනෙක් අභියෝග කර ඇත- http://www.ft.lk/news/SC-lists-24-Sep-for-support-of-FR-petition-challenging-Presidential-pardonof-Sunil-Ratnayake/56-703402

[49] https://www.cps.gov.uk/publication/code-crown-prosecutors වෙත ප්‍රවේශ විය හැකිය. තනි විෂය කරුණු වලට අදාළ මාර්ගෝපදේශ ලැයිස්තුවක් මෙහි සොයාගත හැකිය https://www.cps.gov.uk/prosecution-guidance

[50] 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 14 වන වගන්තිය බලන්න

පත් කරනු ලැබ තිබේ.[51] නීතිපති ධුරයෙන් ඉවත් කිරීම සඳහා දැඩි නිර්ණායකයක් පිහිටුවා තිබුණද, පත්වීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායකයන් ගැන එතරම් තැකීමක් නොමැති බව පෙනේ.

වර්ෂ 2002 අංක 2 දරන නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 2 වන වගන්තියේ සඳහන් වන්නේ පනතේ දක්වා ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය නොකරන්නේ නම් නීතිපති ධුරයෙන් ඉවත් කළ නොහැකි බවයි. පනතේ 3 වන වගන්තිය මගින් නීතිපති තනතුර දරන තැනැත්තාව එකී ධුරයෙන් ඉවත් කළ හැකි හේතු පෙන්වා දෙනු ලබයි. ඉවත් කිරීමේ ආකාර දෙකක් මෙම පනත මගින් පෙන්වා දේ. පළමුවෙන්ම ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීම, එනම්, නීතිපති ධුරය දරන පුද්ගලයා නිසි අධිකරණයක් මගින් වස්තු භංගත්වයට පත් වූ බවට විනිශ්චය කර ඇති බවට හෝ ප්‍රමාණවත් හේතුවක් නිසා ධුරයේ රැඳී සිටීමට නොහැකි බවට එනම්, අසනීප හෝ ශාරීරික හෝ මානසික දුර්වලතා හෝ සදාචාරාත්මක අවුල් සහගත ලෙස දුරාචාරී කටයුතු වල යෙදුනු, රාජද්‍රෝහී හෝ අල්ලස් සම්බන්ධ වරදකට වැරදිකරුවෙකු වී හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම නතර කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇතැයි ජනාධිපතිවරයාගේ මතය වන කල්හි එසේ ඉවත් කළ හැකිය.[52]

දෙවනුව ගත් කළ, නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 3 වන වගන්තියේ සඳහන් ඉවත් කිරීමේ වෙනත් පදනම් වලට අදාල විෂය පථයට අයත් කාරණයක් සම්බන්ධයෙන්[53] නීතිපති ධුරය දරන පුද්ගලයාට එරෙහිව චෝදනා කරනු ලබන්නේ නම්, එවිට නීතිපති ධුරයෙන් ඉවත් කළ හැකි අතර එහිදී එකී නීතිපති තනතුර දරන ඔහු / ඇය ඉවත් කරන ලෙස ඉල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයක් (පැමිණ සිටින හා ඡන්දය ප්‍රකාශ කරනු ලබන) විසින් යෝජනාවක් සම්මත කරනු වුවහොත් පමණක් එවන් ඉවත් කිරීමක් සිදු කළ හැකිය.[54] කෙසේ වෙතත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එවැනි යෝජනාවක් සලකා බැලිය හැක්කේ අදාල පෙරකී පනත ප්‍රකාරව පත් කරන ලද විමර්ශන කමිටුව[55] විසින් පුද්ගල චෝදනාව ඇත්ත වශයෙන්ම ඔවුන්ට එරෙහිව නගා ඇති චෝදනාවලට වැරදිකරු බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණි.[56]

---

51 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIA පරිච්ඡේදය සංශෝධනය කරමින් 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ 6 වන වගන්තිය. සම්පූර්ණ විශ්ලේෂණයක් සඳහා බලන්න https://www.cpalanka.org/wp-content/uploads/2020/09/Final-doc-Summary-of-Changes-Under-the-Proposed-20th-Amendment.pdf

52 වර්ෂ 2002 අංක 2 දරන නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 4 වන වගන්තිය

53 විෂමාචාරයට හෝ දූෂණයට වැරදිකරුවන් වීම, ඔහුගේ කාර්යාලයේ අධික ලෙස බලය අයුතු ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වීම, රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන් වැරදිකරු වීම, කාර්යාලයේ දළ වශයෙන් පක්ෂග්‍රාහී වීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වීම.

54 එස්. 18 2002 අංක 2 දරන නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ එස් 5 සමග කියවන්න

55 නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 5 වන වගන්තියට අනුව, විමර්ශන කමිටුවක් පත් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයකගේ (පැමිණ නැති අය ද ඇතුළුව) බහුතරයකගේ සහාය ඇතිව යෝජනාවක් සම්මත කළ යුතුය. නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 56 (අ) වගන්තිය ප්‍රකාරව, නීතිපතිවරයා සම්බන්ධව විමර්ශනය සිදු කෙරෙන අතර, කමිටුව පුද්ගලයන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, සභාපතිවරයා අගවිනිසුරු සහ තවත් පුද්ගලයින් දෙදෙනෙකු විය යුතුය. මීට පෙර නීතිපති ධුරය හෙබවූ පුද්ගලයින්ගෙන් හෝ නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයට පත්වූ පුද්ගලයින්ගෙන් පත් කරනු ලැබේ. කථානායකවරයා විසින් මෙම පත්වීම් කරනු ලබන්නේ අග්‍රාමාත්‍යවරයාගේ සහ විපක්ෂ නායකවරයාගේ එකඟතාවයෙනි.

56 2002 අංක 2 දරන නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 5 වන වගන්තිය සමග කියැවෙන 17 වන වගන්තිය

***නීතිපතිවරයා රජයේ උපදේශක සහ රජයේ අභිචෝදකවරයා වීම නිසා***
***ලැදියාවන් පිළිබඳ ගැටුමක් උද්ගත වන්නේ කෙසේද?***

*රජයේ උපදේශක වශයෙන් නීතිපතිවරයාගේ කාර්යභාරය, රජයේ අභිචෝදකවරයාගේ කාර්යභාරය සහ රාජ්‍ය නිලධාරීන්ගේ උපදේශකවරයාගේ කාර්යභාරය ආදී භූමිකාවන් හේතුවෙන් ඔහුගේ ස්වාධීනත්වය නොමැතිකම විවේචනයට ලක්ව තිබේ. විනිසුරුවන්ගේ සහ නීතිඥයින්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ වාර්තාකරු වූ මොනිකා පින්ටෝ වර්ෂ 2016 දී සිදු කළ ශ්‍රී ලංකාවේ කළ සංචාරයෙහි දී නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඇයගේ මූලික නිරීක්ෂණ හා නිර්දේශයන් ඔස්සේ අධ්‍යයනය කරන ලදී. රජයේ ප්‍රධාන නීති උපදේශක සහ රජයේ ප්‍රධාන අභිචෝදකවරයා ලෙස නීතිපතිවරයා ඉටු කළ ද්විත්ව කාර්යභාරය පිළිබඳව ඇය සිය කනස්සල්ල පළ කළාය. නීතිපතිවරයාගේ කාර්යභාරය පිළිබඳව අදහස් දක්වමින් ඇය පවසන්නේ, 'නීතිපතිවරයා ප්‍රධාන අභිචෝදකවරයා වන අතර, ඒ නිසාම අතීතයේ පැවති ස්වාධීන අභිචෝදක තනතුර වෙනුවට නීතිපති කටයුතු කිරීම සිදුවිය' යනුවෙනි. එවැනි ධාරිතාවයකින් කටයුතු කරනු ලබන නිසාවෙන්, අපරාධ විමර්ශනය කිරීම හා නඩු පැවරීම සඳහා පැහැදිලි හා නිසි මාර්ගෝපදේශ නීතිපතිවරයා විසින් නිකුත් කළ යුතු අතර, වධහිංසා ඇතුළු ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය උල්ලංඝනය කිරීම් ඇතුළු බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා නිශ්චිත මාර්ගෝපදේශ සකස් කළ හැකිය.[57] 'නීතිපතිවරයා රජයේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම, නීතිපතිවරයා නියෝජනය කරන්නේ රජයේ අවශ්‍යතා කෙරෙහි මිස මහජන අවශ්‍යතා සඳහා නොවන බවට හැඟීමක් ඇති කරනු ලබන බවට ඇය තවදුරටත් ප්‍රකාශ කරන ලදී.[58] මෙමඟින් දේශපාලනික වශයෙන් සංවේදී අවස්ථාවන්හි දී පැමිණිල්ලේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වය අවතක්සේරුවට ලක් වීමක් සිදු වීමට කරයි.*

### 3.3. යුක්තිය පසිඳලීමට අදාළ ගැටළු

සංකේතාත්මක නඩු කටයුතු සම්බන්ධයෙන් විමසීමක් කරනු ලබන ප්‍රකාශනයක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් යුක්තිය පසිඳලීම සම්බන්ධ කරුණු කිහිපයක් ඉස්මතු කරන ලදී.[59] දඬුවම් නොලැබීමේ සංස්කෘතියක් සහ ඵලදායී ලෙස යුක්තිය පසිඳලීම පරිපාලනය කිරීමට බාධා ඇති කර ඇති ස්වාධීන පරීක්ෂණ නොමැතිකම ඇතුළු අඛණ්ඩව සිදුවන ගැටළු සම්බන්ධයෙන් මෙකී වාර්තාව ඔස්සේ පෙන්වා දෙනු ලැබේ. අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතක් වර්ෂ 2015 දී හඳුන්වා දුන්නද එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවේ. ඊට අමතරව, අධිචෝදනා ගොනු කිරීමට අදාළ ක්‍රියා පටිපාටිය තුළ පවතින සැලකිය යුතු ප්‍රමාදයන් ද යුක්තිය පසිඳලීම නිසි පරිදි පරිපාලනය කිරීමට බාධා ඇති කරයි.

---

57 විනිශ්චයකාරවරුන්ගේ සහ නීතිඥයින්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, ඇයගේ ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය, මානව හිමිකම් කවුන්සිලය, තිස් පස්වන සැසිවාරය, 2017 ජූනි 6 සිට 23 දක්වා. <https://www.refworld.org/docid/593945584.html>

58 මානව හිමිකම් කවුන්සිලය (2016) විනිශ්චයකාරවරුන්ගේ සහ නීතිඥයින්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, ඇයගේ ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය. https://www.refworld.org/docid/593945584.html

59 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (2019) *'ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ වගවීමේ අවශ්‍යතාවය'* https://www.cpalanka.org/wp-content/uploads/2019/03/FINAL-A-Glance-at-Seven-Emblematiccases-.pdf

***අධිචෝදනා ගොනු කිරීමට අදාළ ක්‍රියා පටිපාටිය කුමක්ද?***

*මිනීමැරීම, මිනීමැරීමට තැත් කිරීම හෝ ස්ත්‍රී දූෂණය කිරීම යන නඩු වලදී අධිචෝදනා පත්‍රයක් මගින් මහාධිකරණයේ නඩු විභාගය පැවැත්වීම අනිවාර්ය වේ. අධිචෝදනා ගොනු කරනු ලබන්නේ නීතිපති විසිනි. මූලික විමර්ශන කටයුතුවල පිටපත් සහ වෙනත් අදාළ ලියකියවිලි ද සමග අදාළ මහේස්ත්‍රාත්වරයා විසින් නීතිපති දෙපාර්තමේන්තුවට යවනු ලැබේ. මංකොල්ලකෑම් වැනි වෙනත් බරපතල අපරාධ වලදී, මූලික විමර්ශනවල සටහන් සහ සාක්ෂිකරුවන්ගේ සහ සැකකරුවන්ගේ ප්‍රකාශයන් නීතිපති දෙපාර්තමේන්තුවෙහි උපදෙස් සඳහා යවනු ලැබේ.*

*ලිපිගොනුවක් නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇති විට, එය එහි ලියාපදිංචි කර නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන නිශ්චිතව අනුයුක්ත කරන ලද නිලධාරියෙකු වෙත යොමු කරනු ලබන අතර, අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා එය රජයේ නීතිඥයෙකු වෙත යවනු ලැබේ. රජයේ නීතිඥවරයා විසින් අදාල ලිපිගොනුව අධ්‍යයනය කර සාමාන්‍යයෙන් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥයෙකු වන ඔහුගේ හෝ ඇයගේ ඉහළ අධීක්ෂණ නිලධාරියා වෙත වාර්තාවක් යවනු ලබයි. එම වාර්තාව මගින් නඩුවේ කරුණු සාකච්ඡා කර, පවතින සාක්ෂි විශ්ලේෂණය කර පහත සඳහන් නිර්දේශයන්ගෙන් එකක් සමග ඉදිරිපත් කරනු ඇත: මහේස්ත්‍රාත්වරයකු විසින් සිදුකරන ලද නඩුවේදී:*

1. *ප්‍රමාණවත් සාක්ෂි ඇත්නම් අධිචෝදනා මහාධිකරණයට ඉදිරිපත් කිරීම.*
2. *මූලික සාක්ෂි නොමැති විට, මහේස්ත්‍රාත්වරයා ඉදිරිපත් කිරීම ඉවත දමා අදාල විත්තිකරු නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයාට නියම කිරීම.*
3. *වැඩිදුර සාක්ෂි සටහන් කර ගැනීමට මහේස්ත්‍රාත්වරයාට උපදෙස් දීම.*

- *පොලිසිය විසින් ලිපිගොනු ඉදිරිපත් කිරීමේදී:*

1. *ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම් සැකකරුවන්ට අධිචෝදනා ගොනුකිරීම*
2. *සාක්ෂි ප්‍රමාණවත් නොවේ නම් සැකකරුවන් නිදහස් කිරීම හෝ*
3. *පොලිසිය නිසි පරීක්ෂණයක් කර නොමැති නම් වැඩිදුර පරීක්ෂණ සඳහා නියෝග කිරීම.*

*අදාල ලිපිගොනුව අධ්‍යයනය කිරීමෙන් පසු වැඩිදුර නෛතික ක්‍රියාමාර්ග ගැනීම ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයාගේ අභිමතය පරිදි වේ.*

අධිචෝදනා ගොනු කිරීමට අදාල වන ඉහත පැහැදිලි කරන ලද ක්‍රියා පටිපාටිය සැබවින්ම දීර්ඝ ක්‍රියාවක් බව පැහැදිලිය. නීතිපති දෙපාර්තමේන්තුවට යවන ලිපිගොනු බොහෝ විට නිසි ක්‍රියාමාර්ගයකින් තොරව පැවතීමට මෙය ප්‍රධාන හේතුවකි.

මෙම අනවශ්‍ය ප්‍රමාදයට පිළියම් කිරීමේ එක් සාධනීය පියවරක් ලෙස හිටපු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරළ මහත්මිය ප්‍රකාශ කරන ලද්දේ අධිකරණ නියෝගයකින් සතියක් ඇතුළත අදාල සාම්පල රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යවන ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇති බව වන අතර එකී ක්‍රියාවලිය වූ කලී සමස්ත නීතිමය ක්‍රියා පටිපාටියම දීර්ඝ කිරීමට හේතු වන ප්‍රධාන ප්‍රමාදයයි.[60] ඇය තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ සියලුම රජයේ ආයතන (නිදසුනක් වශයෙන්, පොලිස් දෙපාර්තමේන්තුව) ඔවුන්ගේ නීතිමය කරුණු ඔවුන්ගේ

[60] දිසානායක, එම්. 'තලතා නීතියේ ප්‍රමාදයන්ට එරෙහිව සටන් කිරීමට පියවර ගෙන තිබේ' (සිලෝන් ටුඩේ, 2019 මාර්තු 13) http://www.ceylontoday.lk/print-edition/2/print-more/26217

නීතිමය අංශ හරහා විසඳා ගැනීම කළ යුතු බවත් අතිශයින්ම වැදගත් අවස්ථාවන්හිදී පමණක් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු වීම සිදු කළ යුතු බවත්ය.[61]

තවද, ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ නීතිපතිවරයාට පවරා ඇති බලතල සහ අභිමතය "කිසිදු අධිකාරියක් විසින් පාලනය කළ නොහැකි" යනුවෙන් විස්තර කර ඇති හෙයින්, එහිදී සංවරණ හා තුලන ක්‍රමයක් නොමැති වීම අභියෝගාත්මක බව සනාථ වී තිබේ.[62] මෙය හුදෙක් සැබෑ පක්ෂග්‍රාහී බවක් නොමැති බව සහතික කිරීමේ අවශ්‍යතාව තවදුරටත් ඉස්මතු කර දැක්වීමට පමණක් නොව, නීති පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා එවැනි පක්ෂග්‍රාහීත්වය පිළිබඳව ඇති ඕනෑම මතයක් ද ඉවත් කිරීම සඳහා ද කළ යුතු වේ.

### 3.4. රජයේ අභිචෝදකවරයාගේ කාර්යාලයක් හඳුන්වාදීමේ යෝජනාව

නීතිපතිවරයා විසින් මෙහෙයවනු ලබන සාපරාධී කාරණා පැවරිය හැකි ආකාරයෙහි ස්වාධීන රජයේ අභිචෝදකවරයෙකුගේ කාර්යාලයක් ශ්‍රී ලංකාවට තිබිය යුතුද යන්න පිළිබඳ ගැටලුවේ ආරම්භයේදීම සඳහන් කළයුතු කාරණයක් වන්නේ, වර්ෂ 1972 දී අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ ශ්‍රී ලංකාවට රජයේ නඩු විභාග අධ්‍යක්ෂකවරයෙකුගේ කාර්යාලයක් (Director of Public Prosecutions- DPP), ස්ථාපිතව තිබූ බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. කෙසේ නමුත්, එය 'ස්වාධීන අධිකාරියක්' නොවූ අතර, නීතිපති යටතේ නියෝජිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය.[63] වර්ෂ 1972 නොවැම්බර් 09 වන දින මෙකී පනත් කෙටුම්පත අති බහුතරයකින් සම්මත විය. රජයේ නඩු විභාග අධ්‍යක්ෂකවරයාගේ බලතල පහත පරිදි විය:[64]

1. ඇතැම් ආකාරයේ නඩු පැවරීම් සඳහා කොන්දේසි.
2. අත්අඩංගුවේ පසුවන සැකකරුවන් රිමාන්ඩ් කිරීම සඳහා මහාධිකරණයට අයදුම් කිරීමට බලය.
3. පුද්ගලික නඩු පවරා ගැනීමේ බලය.
4. විමර්ශන සම්බන්ධයෙන් පොලිසියට යොමු කිරීම සහ දුෂ්කර අවස්ථාවල දී උපදෙස් ලබා දීම.
5. මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු විභාග නොකිරීමට හෝ ඉල්ලා අස්කර ගැනීම් සම්බන්ධයෙන් වන තීරණ ගැන දැනුම්වත් වීමට ඇති බලය.

රජයේ නඩු විභාග අධ්‍යක්ෂකවරයා අධිකරණ අමාත්‍යාංශයට සහ නීතිපතිවරයාට වගකිව යුතු විය. රජයේ නඩු විභාග අධ්‍යක්ෂකවරයා විසින් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රිට් මගින් යොමු කිරීමේ හැකියාව ශ්‍රේෂ්ඨාධිකරණයට ද ඇත. කෙසේ නමුත්, එම කාර්යාලය 1978 දී අහෝසි කරන ලදී. රජයේ

---

61 හැන්සාඩ් - 12 මාර්තු 2019, පි .1039 https://www.parliament.lk/uploads/documents/hansard/1552739539039076.pdf

62 හිටපු නීතිපති ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු "ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ කාර්යභාරය සහ නීතියේ ආධිපත්‍යය; අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ විශේෂ සඳහනක් සහිතව", (2016) දිවංගත සී. ආර්. ද සිල්වා මහතාගේ 3 වන මරණ සංවත්සරයේදී පවත්වන ලද දේශනය. http://www.sundaytimes.lk/161113/palitha_orations.pdf

63 ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (2012) 'වගවීමකින් තොරව අධිකාරිය': ශ්‍රී ලංකාවේ දඬුවම් නොලැබීමේ අර්බුදය' p. 72 යි http://www.refworld.org/pdfid/50ae365b2.pdf

64 *ඉහත පිටුව.73*

නඩු විභාග අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලය සෘජු දේශපාලන පීඩනයකට ලක් වූ අතර 1977 රජය යටතේ එකී කාර්යාලය අහෝසි කිරීමට එම තත්වය හේතු විය.[65]

වර්ෂ 1994 බස්නාහිර, දකුණු හා සබරගමුව පළාත් සම්බන්ධයෙන් ස්ථාපිත කළ අතුරුදහන් වීමේ කොමිෂන් සභාව සහ වර්ෂ 1998 දී ස්ථාපිත කළ සමස්ත දිවයින සම්බන්ධයෙන්ම වන අතුරුදහන් වීම් කොමිෂන් සභාව යන දෙක මගින්ම ස්වාධීන අභිචෝදක කාර්යාලයක් සඳහා නිර්දේශය ඉදිරිපත් කරන ලද්දේ ඔවුන්ගේ නිරීක්ෂණ සමඟ නඩු පැවරීමේ ස්වාධීනත්වයේ බරපතල අඩුපාඩුවක් ඉස්මතු කරමිනි.[66]

ශ්‍රී ලංකාව තුළ රජයේ අභිචෝදක කාර්යාලයක් හඳුන්වා දීමේ අවශ්‍යතාවය පිළිබඳව වඩාත් මෑත දී සිදු කර ඇති අධ්‍යයනයන් මගින් අවධාරණය කර ඇත්තේ එවැනි කාර්යාලයක් පිහිටුවීම මඟින් නඩු පැවරීමේදී ස්වාධීනත්වය පිළිබඳ ප්‍රබල මතයක් ස්ථාපිත වනු ඇති බවයි.[67] විශේෂයෙන්ම ගැටුම් ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඔවුන්ගේ නඩු විභාගයන්ට විධායක ක්‍රියාමාර්ගයක් මඟින් බාධාවක් නොවන බව සහතික කිරීම සඳහා සහ වින්දිතයින්ගේ විශ්වාසය දිනා ගැනීම සඳහා රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම සුවිශේෂී අදාලත්වයක් පෙන්නුම් කරයි.[68] මෙකී මාතෘකාව පිළිබඳ සිදුකර ඇති ඇතැම් අධ්‍යයනයන් ඔස්සේ පෙන්වාදී ඇත්තේ රජයේ අභිචෝදක කාර්යාලයක් හඳුන්වා දීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය නොවන බවත් සාමාන්‍ය ව්‍යවස්ථා සංශෝධනයක් පමණක් ප්‍රමාණවත් බවත්ය.[69]

නීතිපති දෙපාර්තමේන්තුවේ නඩු පැවරීමේ අංශයට විකල්පයක් ලෙස රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමට වරින් වර යෝජනා කර ඇත්තේ විශේෂයෙන්ම රජය හෝ රජයේ නියෝජිතයින් සම්බන්ධ වන්නා වූ බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් හෝ අපරාධ පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් වන තත්වයන් සලකා බැලීමෙනි. රජයේ අභිචෝදක කාර්යාලයක් විකල්පයක් ලෙස සලකනු ලබන්නේ හුදෙක් මතුපිටින් විද්‍යමාන වන ස්වාධීනත්වයේ අඩු ලුහුඬුකම් හෝ ලැදියාවන් සම්බන්ධයෙන් වන පිළිගැටුම් වලට අවැසි පිළියම් යෙදීම සඳහා පමණක් නොව, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ අපරාධවලට ගොදුරු වූවන්ගේ විශ්වාසය ගොඩනැගීම ද සඳහා ය. මෙය වැදගත් වන්නේ ස්වාධීනත්වය හා අපක්ෂපාතී ලෙස ක්‍රියා කරන නඩු පැවරීමේ කාර්යයට අමතරව, එය ස්වාධීනව ක්‍රියාත්මක වන බව වටහා ගැනීම වැදගත් වන බැවිනි. වෙනත් ආකාරයකින් කිවහොත්, අපරාධ යුක්ති විනිශ්චය යාන්ත්‍රණයේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වය අපරාධවලට ගොදුරු වූවන්ට යුක්තිය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කරයි.

---

65 පින්ටෝ-ජයවර්ධන, කේ. (2010) 'ශ්‍රී ලංකාවේ තවමත් යුක්තිය පතයිඃ නීතියේ ආධිපත්‍යය, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය සහ 1977 සිට විමර්ශන කොමිෂන් සභා' p.135 http://humanitariansrilanka.org/newchapdf/IHR/Sri%20Lanka_final_3.pdf

66 *ඉහත එම.*

67 ෆොන්සේකා, බී සහ ලින්ස්ට්‍රම්-නිවුමන්, එම් (2019) ' ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර අපරාධයන්ට එරෙහිව නඩු පැවරීම : රාජ්‍ය නඩු පවරන නිලධාරී කාර්යාලය සඳහා අවශ්‍යතාවක්' "ශ්‍රී ලංකාවේ විනිශ්චයට කාලයයිඃ ගැටුම් ආශ්‍රිත අපයෝජනයන් පිළිබඳ නඩු පැවරීම." ආචාර්ය ඉසබෙල් ලැසී විසින් ( 2019) (සංස්) දකුණු ආසියානු නීති අධ්‍යයන මධ්‍යස්ථානය.

68 *ඉහත එම*, පිටුව 181

69 ජයසිංහ, යූ සහ ලසී. අයි 'ශ්‍රී ලංකාවේ රජයේ නීතිඥ කාර්යාලයක් පිහිටුවීම' පි. 195 "ශ්‍රී ලංකාවේ විනිශ්චයට කාලයයිඃ ගැටුම් ආශ්‍රිත අපයෝජනයන් පිළිබඳ නඩු පැවරීම." ආචාර්ය ඉසබෙල් ලැසී (2019) (සංස්) දකුණු ආසියානු නීති අධ්‍යයන මධ්‍යස්ථානය.

රජයේ අභිචෝදකවරයකුගේ කාර්යාලයක් හරහා ලබා ගත හැකි තාක්ෂණික විශේෂඥතාව, ශ්‍රී ලංකාවේ උද්ගත වූ ගැටුම්කාරී තත්වයෙහි ජනවාර්ගික ස්වභාවය සහ එවැනි ආයතනයක දේශපාලන මැදිහත්වීම් නොමැතිකම ආදී වශයෙන් වූ හේතූන් නිසාවෙන් ගැටුම් ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් රජයේ නීතීඥ කාර්යාලයක් පිහිටුවීම සඳහා විශේෂ සහාය ලැබී තිබේ.[70]

දේශපාලන උපදේශකයකු සහ අපරාධ නඩු පවරන්නෙකු වශයෙන් නීතිපතිවරයාගේ කාර්යභාරය පිළිබඳ ද්විත්ව භූමිකාව සම්බන්ධයෙන් වන තතත්වය වෙනත් රටවල්හි හඳුනාගෙන ඊට අදාල ගැටළුකාරී තත්වයන් විසඳා ඇත.[71] එක්සත් රාජධානියේ නීතිපති සහ රජුගේ නඩු පැවරීමේ සේවය අතර බෙදීමක් ඇති වී තිබේ. රජුගේ නඩු පැවරීමේ සේවය මඟින් අපරාධ නඩු පැවරීම සිදු වන අතර, නීතිපති කාර්යාලය කැබිනට් අමාත්‍යංශයක් හා සමාන තත්වයෙන් පවත්වාගෙන යනු ලබන අතර එය දේශපාලන පත්වීමක් ලෙස සැලකේ. ඇමරිකා එක්සත් ජනපදයේ නීතිපතිවරයා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර අපරාධ නඩු පැවරීම් අධීක්ෂණය කරනු ලබන යුක්ති දෙපාර්තමේන්තුවේ මුලසුන හොබවයි. කෙසේ වෙතත්, දේශපාලන උත්තේජනයක් හෝ සංවේදී ස්වභාවයක් ඇති නඩු කටයුතු ස්වාධීන හෝ රජයේ අභිචෝදකයින්ට පවරනු ලැබේ.

70 ෆොන්සේකා, බී. සහ ලින්ස්ට්‍රම්-නිව්මන්, එම්. (2019) ‘ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර අපරාධ නඩු පැවරීම: රජයේ නීතීඥවරුන්ගේ කාර්යාලයක අවශ්‍යතාවය’ p.180 “ශ්‍රී ලංකාවේ විනිශ්චයට කාලයයි: ගැටුම් ආශ්‍රිත අපයෝජනයන් පිළිබඳ නඩු පැවරීම.” ආචාර්ය ඉසබෙල් ලැසී (2019) අධ්‍යයන.

71 ජනාධිපති නීතිඥ සාලිය පීරිස් “ ‘දෙපාර්තමේන්තුව’ වටලනු ලැබේ; නීතිපතිගේ අනාගතය’ ” (කොළඹ ටෙලිග්‍රාෆ්, 2015 ඔක්තෝබර් 25) https://www.colombotelegraph.com/index.php/the-department-under-siege-the-futureof-the-attorney-general/

## 4. ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේදී නීතිපතිගේ කාර්යභාරය

ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය හා පනත් සම්මත කිරීම සම්බන්ධයෙන් යම් යම් කාර්යභාරයන් ඉටු කිරීමට නීතිපතිවරයාට ව්‍යවස්ථානුකූලව බලය ඇත. කෙසේ නමුත්, මෙම වෙනස් භූමිකාවන් අනිවාර්යයෙන්ම එකිනෙකට සමපාත නොවේ. ඒවා පහත පරිදි කෙටියෙන් පැහැදිලි කර ඇත-

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 77 වන වයවස්ථාව මඟින් පනත් සම්මත කිරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ කාර්ය කර්තව්‍යයන් දක්වා ඇත.[72] ඒ අනුව, 82 (1) සහ (2)[73] වගන්තිවල අවශ්‍යතා උල්ලංඝනය වීම සහ පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයක් අවශ්‍ය වන ඕනෑම විධිවිධානයක් සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා නීතිපතිවරයා විසින් සෑම පනත් කෙටුම්පතක්ම පරීක්ෂා කළ යුතුය. පනත් කෙටුම්පතක් විශේෂ බහුතරයකින් හැර සම්මත කළ නොහැකි බව නීතිපතිවරයාගේ මතය නම්, ඔහු එම කරුණ ජනාධිපතිවරයාට දැනුම් දිය යුතුය. යෝජිත පනත් කෙටුම්පතකට සංශෝධනයක් සිදු වුවහොත් ඔහු තම මතය කථානායකවරයාට දැනුම් දිය යුතුය.

- පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නම්, ස්ථාවර නියෝගවල 52 වන වගන්තියේ සඳහන් වන්නේ, පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිද යන්න සහ එය සම්බන්ධයෙන් යම් බාධාවක් ඇති කරන්නේද යන්න සහ එමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් කිසියම් බාධාවක් ඇති කරන්නේ ද යන්න පිළිබඳව තම මතය විමසීමට පාර්ලිමේන්තු මහලේකම්වරයා විසින් පනත් කෙටුම්පත නීතිපති වෙත යොමු කළ යුතු බවයි. නීතිපතිවරයා විසින් ස්වකීය නිරීක්ෂණ සති හයක් තුළ පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතුය.

- තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් තීරණය කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම, මූලික අයිතිවාසිකම් පිළිබඳ කරුණු, ජනාධිපතිවරයා හෝ කථානායකවරයා විසින් යොමු කරනු ලබන උපදේශන කරුණු සහ පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කරනු ලබන අවස්ථාවන්හි දී ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට නීතිපතිවරයාට අයිතියක් ඇත.

---

[72] "77. (1) 82 වන වගන්තියේ (1) සහ (2) ඡේදවල අවශ්‍යතාවන්ට පටහැනිව කටයුතු කිරීම සහ නියම කරන ලද විශේෂ බහුතරය හැර වලංගු නොවන ඕනෑම විධිවිධානයක් සඳහා සෑම පනත් කෙටුම්පතක්ම පරීක්ෂා කිරීම නීතිපතිවරයාගේ යුතුකම වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්; සහ මෙම වගන්තිය යටතේ නීතිපතිවරයාට සිය රාජකාරි ඉටුකිරීමට සහාය වන ඕනෑම නිලධාරියෙකුට එම රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දිය යුතුය.
(2) 82 වන වගන්තියේ (1) සහ (2) ඡේදවල කිසියම් අවශ්‍යතාවයකට පනත් කෙටුම්පතක් උල්ලංඝණය වන බවට හෝ පනත් කෙටුම්පතක කිසියම් විධිවිධානයක් නියම කර ඇති විශේෂ බහුතරය හැර වලංගු නොවන බව නීතිපතිවරයාගේ මතය නම්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඔහු එවැනි මතයක් ජනාධිපතිවරයාට දැනුම් දිය යුතුය.
පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතකට යෝජනා කරන ලද සංශෝධනයක් සම්බන්ධයෙන්, පනත් කෙටුම්පත පිළිගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම් වන අවස්ථාවේ දී නීතිපතිවරයා තම මතය කථානායකවරයාට දැනුම් දිය යුතුය."

[73] "82. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසියම් විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වන කිසිදු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ නියෝග පත්‍රය මත තැබිය යුතු නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ පනතක් ලෙස එහි දීර්ඝ මාතෘකාවෙහි විස්තර කර ඇත. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවලංගු කිරීම සඳහා වන විධිවිධාන පනත් කෙටුම්පතේ අඩංගු නොවන්නේ නම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවලංගු කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වූ පනතක් ලෙස එහි දීර්ඝ මාතෘකාවෙහි විස්තර කර ඇත්නම් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවලංගු කිරීම සඳහා වන කිසිදු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතුය.

විධායකයේ ස්ථාවරය බොහෝවිට නීතිපතිවරයාගේ ස්ථාවරය ද වීම දිගු කාලීන පරිචයක් බවට පත්වී තිබේ. මෙම වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි, වැදගත් වන්නේ නීතිපතිවරයා සිය කාර්යභාරය අපක්ෂපාතී ලෙස ඉටු කිරීම පමණක් නොව, එසේ කරනු ලබන බවට මතයක් ස්ථාපිත වීමයි. ලැදියාවන් සම්බන්ධයෙන් වන පිළිගැටුම හෝ ඔහුගේ කර්තව්‍යයන්හි පවතින එකිනෙක මත රඳා පැවතීම හෙවත් අතිච්ඡාදනය එවැනි සැබෑ හෝ විද්‍යමාන මධ්‍යස්ථභාවයට අහිතකර ලෙස බලපානු ලබයි.

ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේදී නීතිපතිගේ කාර්යභාරය පිළිබඳව, *ඉඩම් ප්‍රතිසංස්කරණ කොමසාරිස් එදිරිව ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ලිමිටඩ්*[74] නඩුවේ දී වැදගත් තීන්දුවක් ප්‍රකාශයට පත් කරමින් අග විනිසුරු සමරකෝන් ප්‍රකාශ කරන ලද්දේ,

> *"මේවායේ බලපෑම කුමක්ද? ඔහු පනත් කෙටුම්පත පිළිබඳ උපදෙස් ලබා දුන් විට සහ ඔහු පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් කළ විට ඔහුව පක්ෂපාතී සහ පක්ෂග්‍රාහී බවට වූ චෝදනාවට නීතිපතිවරයා නිරාවරණය කරයි. උසාවියට ඔහු කළ යුතු යුතුකම, රාජ්‍යයට හා ව්‍යවස්ථාදායකයට ඔහුගේ යුතුකම සහ සේවාදායකයාට ඔහු දක්වන යුතුකම අතර පිළගැටුමක් පෙනෙන්නට තිබේ. නීතිපති අපක්ෂපාතී වන අතර රජය සහ අදාල විෂය අතර සමානව තීරණය කරයි යන පැරණි සංකල්පය සැක සහිත වනු ඇත. අවසානයේදී දුක් විඳින තැනැත්තා අනිවාර්යයෙන්ම යුක්තිය හා යුක්තියේ පරිපාලනය විය යුතුය."*[75]

## 4.1. පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකය පිහිටුවීම සඳහා වූ යෝජනාව

ව්‍යවස්ථා සම්පාදන කෙටුම්පත් ක්‍රියාවලියට සහාය වීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ කාර්යභාරයට විකල්පයක් ලෙස ප්‍රතිපත්ති සම්පාදකයින්ට පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ තොරතුරු ලබාදීමට ඉඩ ප්‍රස්ථාව ඇති කිරීම පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකයක් ස්ථාපිත කිරීමෙන් අපේක්ෂා කෙරේ. ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ විවිධ අවස්ථා වලදී සහ පනත් කෙටුම්පත්හි නෛතිකභාවය තීරණය කිරීමේදී නීතිපතිවරයාගේ කාර්යභාරය අතර පිළිගැටුමක් ඇතිවීම වැළැක්වීමේ අරමුණින් මෙය යෝජනා කෙරේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් වල ප්‍රතිපත්තිමය කරුණු විශ්ලේෂනය කිරීම් ලබා දෙනු ලබන පර්යේෂණ සේවාවන් ඔස්සේ ව්‍යවස්ථාදායක විවාද සඳහා අවැසි තොරතුරු දැනුම් දීමට හැකියාව තිබේ. මෙමඟින් සිදු කරනු ලබන විවාද දැන උගත් අදහස් සහ ප්‍රතිපත්තිමය සාදක මත පදනම් වූවක් වන අතර එමඟින් ව්‍යවස්ථාදායකය තුළ සිදුවන විවාද ක්‍රියාවලිය දේශපාලන පක්ෂග්‍රාහීත්වයේ සීමිත රාමුවෙන් ඔබ්බට යනු ඇත. පර්යේෂණ අංශයේ

74 (1981) 1 ශ්‍රී ලංකා නීති වාර්තා 250

75 *ඉහත එම*, පිටුව 260

ශක්තිමත් භාවය තීරණය වීම උදෙසා එය විධායක හෝ පාර්ලිමේන්තුවෙහි පාලක පක්ෂයෙහි බහුතරයෙන් ස්වාධීනව පැවතීම අවශ්‍ය වේ.

අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ අන්තර්ජාතික පුස්තකාල සංගම් හා ආයතන සම්මේලනය සමඟ පාර්ලිමේන්තු පර්යේෂණ ඒකක පිහිටුවීම සඳහා සවිස්තරාත්මක නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර නිදසුනක් වශයෙන් ජනවරම සහ අධීක්ෂණය පිළිබඳ ප්‍රශ්න මත එසේ කිරීම සුදුසු යැයි පෙන්වා දී තිබේ,

- *"සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පර්යේෂණ සේවාව ලබා ගත හැකි බවට සහතික කිරීම සහ එහි එදිනෙදා කටයුතු පක්ෂග්‍රාහී නොවන බවට වගවීම සිදු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු නිලධාරියෙකු (උදා: මුලසුන දරන නිලධාරියෙකු, මහලේකම්වරයකු, පාර්ලිමේන්තු පුස්තකාලයාධිපතිවරයෙකු හෝ ප්‍රධාන තොරතුරු නිලධාරියෙකු) වගකිව යුතුය.*
- *නිශ්චිත තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් නීතියක ස්වභාවයෙන් හෝ පාර්ලිමේන්තු යෝජනා මගින් සහතික කළ හැකිය. විශ්ලේෂණාත්මක කටයුතු සිදු කිරීම සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ කාර්ය මණ්ඩලයට කෙරෙන ඉල්ලීම් ඇතුළත් කිරීම ද මේ සඳහා අන්තර්ගතවිය හැකිය.*
- *පර්යේෂණ සේවයේ සමස්ත ක්‍රියාකාරිත්වය වාර්ෂිකව සමාලෝචනය කිරීම සඳහා පාලක පක්ෂයෙහි සහ විරුද්ධ පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නියෝජනයෙන් සැදුම්ලත් පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටුවක් පත් කළ හැකිය. කෙසේ වෙතත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා කරන ලද විශ්ලේෂණයේ නිශ්චිත අන්තර්ගතය මත නොව, පර්යේෂණ සේවයේ පොදු දිශානතීන් සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට කමිටුවේ බලතල සීමා කිරීමට සැලකිලිමත් විය යුතුය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා කරන ලද විශ්ලේෂණයේ නිශ්චිත අන්තර්ගතය සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට අවකාශය ලබා දීම තුළින් එලෙස විශ්ලේෂණයන්ට භාජනය කරනු ලබන අන්තර්ගතය නිසැකයෙන්ම දේශපාලනීකරණය වනු ඇත."*[76]

පාර්ලිමේන්තු පර්යේෂණ සේවා සඳහා ඒකකයක් ක්‍රියාත්මක කිරීමේදී ඒ සම්බන්ධයෙන් ආදර්ශවත් ආකෘති කිහිපයක් අධ්‍යයනය කළ හැකිය. කෙසේ නමුත්, කවර අන්දමේ ආකෘතීන් වුවද නීති සම්පාදකයින්ට පර්යේෂණ සේවා ලබා දීමේදී අපක්ෂපාතීත්වය, විශේෂඥතාව සහ කාලානුරූපතාවයේ මූලික ලක්ෂණ පෙන්නුම් කරයි. නිදර්ශනයක් වශයෙන් ගත් කළ, එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු අත්පොත මඟින් පෙන්වාදෙන පරිදි, පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකයක් පිහිටුවීමේදී "AORTA" යන කෙටි යෙදුම මඟින් පිළිබිඹු කරනු ලබන, විශ්වසනීය (Authoritative),

[76] *පාර්ලිමේන්තු පර්යේෂණ සේවා, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ ජාත්‍යන්තර පුස්තකාල සංගම් හා ආයතන සම්මේලනය සඳහා මාර්ගෝපදේශ (IPU, 2015)*

විෂය මූලික (Objective), අදාළ (Relevant), හා කාලෝචිත (Timely) මූලික මූලධර්ම අනුගමනය කිරීමට සුදුසු බවට නිර්දේශ කරනු ලබයි.[77]

එක්සත් රාජධානියේ, ආයතන ගණනාවක් මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා, විවිධ අරමුණු සඳහා සහ විවිධ සන්දර්භයන් යටතේ පර්යේෂණ සේවා සපයනු ලබයි. මහජන මන්ත්‍රී මණ්ඩලයට (House of Commons) සහ සාමි මන්ත්‍රී මණ්ඩලයට (House of Lords) අදාල පුස්තකාල විසින් සපයනු ලබන 'පාර්ලිමේන්තු පර්යේෂණ සේවා', ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඔවුන්ගේ කාර්ය කර්තව්‍යයන්ට සහාය වීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පර්යේෂණ සම්බන්ධයෙන් අදාල තොරතුරු හා දත්ත සපයයි. මෙයට විෂය පදනම් කරගත් පර්යේෂණ මෙන්ම එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ද ඇතුළත් ය. පුළුල් ප්‍රතිපත්තිමය ප්‍රශ්න සම්බන්ධයෙන් සංක්ෂිප්ත විශ්ලේෂන සටහන් ද පොදු මහජනතාවට ලබා ගත හැකිය. අනෙක් අතට ගත්කල, කමිටු කණ්ඩායම් විසින්, අදාල කමිටු වෙත පැවරී ඇති නිශ්චිත කාර්යයන් සිදු කිරීම සඳහා ඇති බලය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දත්ත තොරතුරු රැස්කර, නිදසුනක් වශයෙන්, එකී කාරක සභාවන්හි වාර්තා සැකසීමේදී සාක්ෂි අධ්‍යයනය කිරීමෙන් සහ දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් ඒවාට සහාය වේ. මෙම කණ්ඩායම් සාමාන්‍යයෙන් විෂය කරුණු සම්බන්ධයෙන් විශේෂඥයින්ගෙන් සමන්විත වන අතර සපයනු ලබන පර්යේෂණ සහායන්හි රහස්‍යභාවය සුරක්ෂිත කරනු ලැබේ. තෙවනුව ගත්කල, විශේෂඥ පර්යේෂණ මධ්‍යස්ථාන ඉහළ විශේෂඥතාව, තාක්ෂණික හෝ සංකීර්ණ යන අංශ සම්බන්ධයෙන් පර්යේෂණ සේවා සපයනු ලබයි. නිදර්ශනයක් වශයෙන් ගත්කල, විද්‍යා හා තාක්ෂණ පිළිබඳ පාර්ලිමේන්තු කාර්යාලය සහ නෛතික හා මූල්‍ය විශේෂඥතාව පිළිබඳ පර්යේෂණ සපයන මහජන මන්ත්‍රී මණ්ඩලයෙහි සෝදිසි කිරීමේ ඒකකය ඇතුළත් වේ.[78]

මධ්‍යම යුරෝපීය හා බෝල්කන් කළාපයෙහි රටවල් 11 ක 'පාර්ලිමේන්තු පර්යේෂණ හා තොරතුරු සේවා' සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද වාර්තාවකට අනුව පෙනී යන්නේ, පවතින රජයන්ගෙන් ලබා ගැනීමට අපහසු විය හැකි නමුත්, කරුණු පදනම් කරගත්, අපක්ෂපාතී සහ විශ්වසනීයත්වයෙන් යුත් පර්යේෂණ ලබා දීම් හරහා පාර්ලිමේන්තු පර්යේෂණ සේවා සිදු කිරීමෙන් "ව්‍යවස්ථාදායකයේ නීත්‍යානුකූලභාවය" වැඩි දියුණු කරන බවත් එකී තත්වය විශේෂයෙන්ම පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අදාල වන බවත්ය.[79] නිදර්ශනයක් වශයෙන් ගත්කළ, හංගේරියාවේ සපයනු ලබන පර්යේෂණ සේවාවන්හි කොටසක් වන "බ්‍රිජ් (Bridge)" ප්‍රකාශන මගින්, පවත්නා ජාතික නීතිය, තුලනාත්මක නීති සහ අදාල කාරණය පිළිබඳ නීති විද්‍යාව සහ අදාළ විෂය පිළිබඳ සංඛ්‍යානමය හා අධ්‍යයන දත්ත අධ්‍යයනය කිරීමෙන් නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට සහාය වේ. පෝලන්ත පර්යේෂණ කාර්යාංශය (Polish Bureau of Research) වූ කලී ස්වකීය ආයතනික කේන්ද්‍රීය පර්යේෂණ සිදුකිරීමට අමතරව එය ආවරණය කරන පුළුල් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව සලකා බලන කල එය

---

[77] *පාර්ලිමේන්තු පර්යේෂණ අත්පොත, පාර්ලිමේන්තුව (එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව, 2017) වෙත ප්‍රවේශ විය හැකිය* <https://www.parliament.uk/globalassets/documents/commons-library/hoc-library-parliamentaryresearch-handbook.pdf>

[78] ඉහත එම

[79] *මධ්‍යම යුරෝපයේ සහ බටහිර බෝල්කන්හි පාර්ලිමේන්තු පර්යේෂණ සේවාවන් සංවර්ධනය කිරීම, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය.* <https://www.ndi.org/sites/default/files/development-of-parliamentary-research-services-CEE.pdf> *වෙත ප්‍රවේශ විය හැකිය.*

ආදර්ශමත් තත්වයක් බව විද්‍යමාන වේ.[80] මෙම වාර්තාව මඟින් අධ්‍යයනය කරන ලද පර්යේෂණ ඒකක 11 ම ආරම්භයේ දී ඔවුන්ගේ ජාතික මට්ටමේ විෂය සීමාවට වඩා ඉදිරියට ගිය අතර යුරෝපා සංගමය ඒකාබද්ධ කිරීම හා යුරෝපා සංගම් නීතිය සංවර්ධනය කිරීම සඳහා කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන ලදි. සංවිධාන ස්වරූපය හා ස්ථානගත කිරීම සම්බන්ධයෙන් ගත් කල, මෙකී පර්යේෂණ ඒකක විසින් අදාල ආකෘති තුනෙන් එකක් අනුගමනය කරනු ඇති අතර, එනම්, පර්යේෂණ ඒකකය පාර්ලිමේන්තු පුස්තකාල සේවා යටතේ ස්ථානගත කර ඇති අතර එහි දී අදාල අංගයන් ද්විත්වය එකිනෙකට යටත් නොවී එකිනෙකට ප්‍රතිපූරණ වන සේ පවත්වාගෙන යනු ලැබීම හෝ පාර්ලිමේන්තු පුස්තකාල සේවාව අදාල පර්යේෂණ ඒකකය යටතේ ස්ථාපිත කිරීම සිදුව තිබේ.

[80] ඉහත එම. ඉහත අධ්‍යයනයේ දී, පෝලන්ත පාර්ලිමේන්තු චාන්සලරි හි විෂයමාලා ආශ්‍රිත ඒකක නවයක් සහිත වඩාත් පුළුල් කාර්ය මණ්ඩලයක් සහිත පර්යේෂණ ඒකකයක් ඇති අතර, පළමු වාරයේ (1991-1993) විශේෂඥ වාර්තා 2,114 ක් සහ එහි 4 වන වාරය (2001-2005) සඳහා විශේෂඥ වාර්තා 11,681 ක් සකස් කර ඇත.

## 5. රජයේ උපදේශක ලෙස නීතිපති

වර්තමානයේදී, නීතිපති දෙපාර්තමේන්තුව විසින් නීතිමය උපදෙස් ලබා දෙනු ලබන්නේ, උපදෙස් ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් මත හෝ මධ්‍යම රජය, පළාත් සභා, රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනවලට ව්‍යවස්ථානුකූලව සහ වාණිජ අධිකරණ බලය ද ඇතුළුව සිවිල් සහ සාපරාධී කාරණා සම්බන්ධයෙන් ස්ව කැමැත්තෙන්ය.[81] රජයේ ප්‍රධාන උපදේශක ලෙස නීතිපතිවරයා මෙම කාර්යය රඳවා තබා ගැනීමට යෝජනා කරනු ලබන අතර, එහි දී නඩු පැවරීමේ හා ව්‍යවස්ථාදායක කටයුතු වෙනත් ස්වාධීන ආයතන වෙත පවරා දීම ද යෝජනා කරනු ලැබේ. මෙම උපදේශන කාර්යයේ අර්ථය වනුයේ නීතිපතිවරයා රජයේ නීතිඥයා ලෙස කටයුතු කරන අතර රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටිමින් අධිකරණ, අර්ධ අධිකරණ හා ජාත්‍යන්තර සංවිධාන ඉදිරියේ පෙනී සිටින බවයි.

ප්‍රතිසංස්කරණ සඳහා කිහිප දෙනෙක් අතීතයේ දී විවිධ ආකෘති යෝජනා කර ඇත. නිදර්ශනයක් වශයෙන්, ජනාධිපති නීතිඥ ජේ. සී. වැලිඅමුණ විසින් "පුද්ගලයන් දෙදෙනෙකු" ගෙන් සැදුම්ලත් ආකෘතියක් යෝජනා කර ඇති අතර, එහිදී අභිචෝදක කාර්යභාරයෙන් තොර නීතිපතිවරයකු විසින් රජයට උපදෙස් දිය යුතු අතර එය උපදේශක වන රාජ්‍යය ආරක්ෂා කළ යුතුය. බරපතල මානව හිමිකම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නඩු පැවරීම සඳහා විශේෂ ස්වාධීන අභිචෝදකවරයකු ස්ථාපිත කිරීමට ඔහු යෝජනා කරන අතර පහත සඳහන් කරුණු සමග පිළිගැටුම් පිළිබඳ ගැටළු මතු කරමින් පෙන්වා දෙනු ලබන්නේ *"නමුත් නඩු පැවරීමට මෙන්ම ඒවායින් ආරක්ෂා කිරීමේ බලයද නීතිපතිවරයාට පැවරීම ප්‍රධාන පිළිගැටුමකි"* බවය.[82] මේ අතර, වෙනස් ආකෘතියක් යෝජනා කරනු ලබන ජ්‍යෙෂ්ඨ නීතිඥ විරාන් කොරෙයා විසින් පෙන්වා දෙනු ලබන්නේ, නීතිපතිවරයා විසින් නඩු පැවරීමේ කාර්යය එලෙසම රඳවාගෙන සිටින පසුබිමක රජයේ නීති උපදේශකවරයාගේ කාර්යභාරය වෙනත් ආයතනයකට නැවත පවරනු ලැබිය යුතු බවයි. ඒ අනුව, *"මම ප්‍රකාශ කරනු ලබන්නේ නීතිපතිවරයාට, ස්වකීය කටයුතු සඳහා ඇවැසි සම්පත් මෙන්ම යාන්ත්‍රණයන් හා පද්ධති ඇති බැවින් ප්‍රධාන අභිචෝදක කාර්යභාරය පවත්වාගෙන යා යුතු අතර රජයට උපදෙස් දීමේ කාර්යභාරය යම් ආකාරයකින් වෙනත් කෙනෙකුට ලබා දිය හැකි ය."*[83] නීතිඥයින් සඳහන් කරන පරිදි, ජාත්‍යන්තර සංවිධාන ඉදිරියේ නීතිපතිවරයා රජය නියෝජනය කරනු ඇතැයි අපේක්ෂා කරන අවස්ථාවන් සම්බන්ධයෙන් ද පිළිගැටුම්කාරී තත්වය පැතිර යා හැකි බවය.[84]

ඒ හා සමාන පිළිගැටුම්කාරී තත්වයක් විධායක ක්‍රියාවන් සම්බන්ධයෙන් ද උද්ගත විය හැකි අතර, වර්ෂ 2018 පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේදී අනුගමනය කළ විධායක ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ද එවැනිම ආකාරයේ පිළිගැටුමක් පිළිබිඹු විය. මෙම ව්‍යවස්ථා අර්බුදය තුළ නීතිපතිවරයා ඉටු කළ කාර්යභාරය පිළිබඳව අදහස් දක්වමින් එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ජයම්පතී වික්‍රමරත්න මහතා පහත දැක්වෙන ආකාරයෙන් අදහස් ඉදිරිපත් කරන ලදි,

> *"පාර්ලිමේන්තුව විසුරුවා හරින විට ජනාධිපතිවරයා නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගත්තේද යන්න ප්‍රශ්නයකි. නමුත් ඔහු එසේ කළ බව අපට නොපෙනේ.* ***කෙසේ වෙතත්, නීතිපතිවරයාට අධිකරණයේ දී ජනාධිපතිවරයාගේ තීන්දුව ආරක්ෂා කිරීමට සිදු විය. එම අවස්ථාවේ දී, නීතිපතිවරයා***

---

81 අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව' https://www.moj.gov.lk/web/index.php?option=com_content&view=article&id=22&Itemid=169&lang=en

82 "ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීම සඳහා නීතිපතිගේ කාර්යභාරය නැවත සමාලෝචනය කළ යුතුය: නීතිඥයින්", ඩේලි එෆ්ටී, 2015.09.29<http://www.ft.lk/news/attorney-generals-role-in-defending-sri-lanka-must-be-revisited-lawyers/56476705>

83 *ඉහත එම*

84 *ඉහත එම*

***ජනාධිපතිවරයා තම සේවාදායකයා ලෙස සැලකූ අතර සේවාදායකයාගේ යහපත වෙනුවෙන් කටයුතු කරන ලදී.***

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සෑම මූලික අයිතිවාසිකම් පෙත්සමකම නීතිපතිවරයා පක්ෂයක් ලෙස නම් කළ යුතුය. ජනාධිපතිවරයාට එරෙහිව නඩු පැවරීමක දී නම් එය නීතිපතිවරයාගේ නමින් කළ යුතුය.*

*කෙසේ වෙතත්, සෑම විටම ජනාධිපතිවරයා ආරක්ෂා කිරීමට නීතිපතිවරයා බැඳී සිටින බව මින් අදහස් නොවේ.* ***එහිදී අවශ්‍ය වන්නේ නීතිපතිවරයා අධිකරණයේ සහයකයකු ලෙස තම ස්වාධීන අදහස් අධිකරණයට ප්‍රකාශ කිරීමයි.*** *මෙම තත්වය තුළ, විශේෂයෙන් පසුගිය දින 52 තුළ උද්ගත වූ මතභේදාත්මක පසුබිම වැනි අවස්ථාවන්හිදී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ඡේද වෙනස් කිරීමට අපට සිදුවනු ඇත.*

*කථානායකවරයා නීතිපතිවරයාගේ උපදෙස් පැතූ එම කාලය තුළ ඔවුන් ප්‍රකාශ කර සිටියේ මෙම ගැටළුව අධිකරණයට ගෙන ගියහොත් ඔවුන්ට ජනාධිපතිවරයා වෙනුවෙන් පෙනී සිටීමට සිදුවිය හැකි බවත් කථානායකවරයාට උපදෙස් දීම ප්‍රතික්ෂේප කරනු ලබන බවත්ය. ඒ හා සමගාමීව රජයේ නීති උපදේශකවරයා නීතිපති ය. එබැවින් එහිදී ලැදියාවන්ගේ පිළිගැටුමක් පවතී. සේවාදායකයකු ලෙස ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි නීතිපතිවරයාට කටයුතු කිරීමට සිදුවුවහොත් ඔවුන්ගේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නගී.'[85] (අවධාරණය කරන ලදි).*

එනිසා, ව්‍යවස්ථානුකූලව අවශ්‍ය වුවද, නීතිපතිවරයාට ඔහුගේ වර්තමාන රාජකාරි සියල්ලම අපක්ෂපාතීව හා ස්වාධීනව කටයුතු කිරීම ඉටු කළ නොහැකි බව පැහැදිලිය. මේ අනුව, විශේෂයෙන් නඩු පැවරීමේ සහ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියෙහි දී ඔහුගේ කාර්යභාරයට අයත් ඇතැම් කාර්යයන් පැවරීම සහ/හෝ නැවත පැවරීම, වර්තමානයෙහි ඒ සම්බන්ධයෙන් පවතින ලැදියාවන් පිළිබඳ පිළිගැටුම් තත්වය ඉවත් කරනු ඇත.

නීතිපතිවරයා රජයේ උපදේශක ලෙස කටයුතු කරනු ලැබුව ද, එය රජයේ කාර්යාලයක් බව මතක තබා ගත යුතුය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කර ඇති පරිදි සහ මීට පෙර මෙම වාර්තාවෙහි ඉස්මතු කර පෙන්වා දී ඇති පරිදි නීතිපතිවරයාගේ බලතල වන්නේ

*"රාජ්‍ය නිලධාරීන්ට නීතියෙන් පවරා ඇති වෙනත් බලතල වලට සමානය.* ***ඒවා මහජනතාව කෙරෙහි භාරයක් වශයෙන් ඇති අතර,*** *ඒවා වෙනත් කාරණයක් සඳහා නොව, පවරා ඇති අරමුණු සඳහා පමණක් යොදා ගැනීම කළ යුතුය.'[86]* (අවධාරණය කරන ලදි)

"අධිකරණ සහයකයකු" ("amicus of the Court") වශයෙන් නීතිපතිවරයා අධිකරණයට සහාය විය යුතු බව පෙන්වා දී ඇති බව නැවත අවධාරණය කළ යුතුය.[87]

[85] නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන කිරීමට යෝජනාව, ඩේලි එෆ්ටී, 09.04.2019 <http://www.ft.lk/front-page/Proposal-to-make-Attorney-General-s-Dept--independent-%C2%A0/44675772>

[86] *වික්ටර් අයිවන් සහ. නීතිපති (1998) 1 ශ්‍රීඑල්ආර් 340*

[87] නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන කිරීමට යෝජනාව, ඩේලි එෆ්ටී, 09.04.2019 <http://www.ft.lk/front-page/Proposal-to-make-Attorney-General-s-Dept--independent-%C2%A0/44675772>

නීතිපති නම් තනතුරට අදාල විෂය පථය පිළිබඳ පැරණිතම හා වඩාත්ම බලපෑම් සහගතම අධ්‍යයනයන්ගෙන් එකක් වන නැන්සි බේකර් (Nancy Baker) විසින් ''අධිනීතිඥ" සහ "මධ්‍යස්ථ" යන ද්විත්ව ආකෘතිය යෝජනා කර ඇත. මෙයින් අධිනීතිඥ යන්නෙන් අදහස් කෙරෙනුයේ නීතිපතිවරයා විධායකයේ උපදේශකයෙකු සහ නීතිඥයෙකු ලෙස කටයුතු කිරීම අපේක්ෂා කිරීම වන අතර වඩාත් සාමාන්‍ය හා මූලික අර්ථයෙන් ගත් කල මධ්‍යස්ථ හෙවත් අපක්ෂපාතී යන්නෙන් අදහස් කෙරෙනුයේ නීතිපතිවරයාගේ නීතියට බැඳී සිටීමේ යුතුකම ඇති බවය. බේකර්ගේ අධ්‍යයනය අනුගමනය කිරීම සඳහා නීතිපතිවරයාගේ උපදේශක කාර්යභාරයේ වෙනත් ආකෘතීන් බොහෝ දුරට බේකර් විසින් යෝජනා කරන ලද, "අධිකරණය කේන්ද්‍රගත", "ස්වාධීන අධිකාරිය" සහ "අවස්ථානුගත" අදී වශයෙන් වූ පුළුල් මාතෘකා ඔස්සේ ජෝන් ඕ. මැක්ගිනිස් (John O. McGinnis) විසින් යෝජනා කළ පරිදි සාරාංශගත කරන ලදි.[88]

වඩාත් සමීප අදාළත්වයක් ඇත්තේ ගයි පවල්ස් (Guy Powles) විසින් සිදු කරන ලද අධ්‍යයනයක් වන අතර එය පොදුරාජ්‍ය මණ්ඩලීය නීති පද්ධතිය පදනම් කොටගත් කුඩා රාජ්‍යයන් සඳහා සුදුසු ආකෘතින් යෝජනා කරනු ලබයි. 'ඒකාබද්ධ' ප්‍රවේශය ('Integrated' approach) මගින් යෝජනා කරනු ලබන්නේ නීතිපතිවරයා දේශපාලන කාර්යාලයක් ලෙස අර්ථ දැක්වෙන අතර එමගින් එය "දේශපාලන ක්‍රියාවලියට පූර්ණ ලෙස ඒකාබද්ධ වී ඇත.'' 'ස්වාධීන' සහ 'අර්ධ - ස්වාධීන' ආකෘතීන් යම් ප්‍රවාහයක් මත පදනම් වන අතර නීතිපති කාර්යාලය අපේක්ෂා කරන අතර, එහිදී 'ඒකාබද්ධ' ආකෘතියට පටහැනි අන්දමට නීතිපතිවරයා සම්පූර්ණයෙන්ම දේශපාලනික නොවන අතර නීතිපති විසින් උපදෙස් ලබා දෙනු ලබන්නේ රජයේ ඉල්ලීම මත පමණි.[89] ඕනෑම ආකාරයක ද්විත්ව ආකෘති අතර දැඩි තේරීමක් කළ නොහැකි හෝ සුදුසු නොවන බව බේකර් නිගමනය කරන විට, යමෙකු ඒ හා එකඟ විය යුතු නමුදු එකී විකල්ප දෙක අතර ප්‍රඥාගෝචර සමතුලිතතාවයක් පවත්වාගැනීම හරහා රජයේ, නීතියේ සහ ජනතාවගේ ලැදියාවන් සම්බන්ධයෙන් වඩාත් සුදුසු වනු ඇත.

---

88 බේලි ඩබ්ලිව්.ආර්., "නීතිපතිවරයාගේ සේවාදායකයා කවුරුන්ද" (2012) 87 නොට්‍රේ ඩේම් නීති සමාලෝචනය 1113

89 පවල්ස් ජී., "මෙතරම් සංකීර්ණ වන්නේ මන්ද: පැසිෆික් දූපත් ජනපදවල නීතිපතිගේ කාර්යභාරය සහ තත්වය සහ ටොංගා නඩුව" (2015) 21 තුලනාත්මක නීති සඳහා නවසීලන්ත සංගමය වාර්ෂික පොත 13

## 6. නිගමනය

මෙම වාර්තාව මඟින්, (අ) අපරාධ නඩු පැවරීම (ආ) ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ (ඇ) රජයට උපදෙස් දීම සම්බන්ධයෙන් වන නීතිපතිවරයාගේ මූලික කාර්ය කර්තව්‍යයන් ත්‍රිත්වයක් පිළිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කර ඇත. මෙම එක් එක් කාර්යයන් ඉදිරියෙහි පවතින සැබෑ හා ප්‍රත්‍යක්ෂ ගැටළු අධ්‍යයනය කිරීමෙන් පසුව, විකල්ප කාර්යාල සහ/හෝ එකී කාර්යයන් පවරන ලද කාර්යාල හඳුන්වාදීම ඇතුළුව ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනා සාකච්ඡා කරනු ලැබේ. රජයේ අභිචෝදකවරයාගේ කාර්යාලයක් මෙන්ම පාර්ලිමේන්තු පර්යේෂණ ඒකකයක් හඳුන්වා දීමේ යෝජනාවට විශේෂ අවධානයක් යොමු කර ඇත.

මෙම වාර්තාව ආරම්භයේ දී, නීතිපති කාර්යාලය සම්බන්ධයෙන් වන ප්‍රතිසංස්කරණ අර්ථවත් වීමට වසර ගණනාවක් පුරා විකාශනය වන ක්‍රියාවලියක් විය යුතු බව පෙන්වා දී ඇති අතර, නීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වන වෙනත් ආයතන සහ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් අදාල වන වෙනත් ප්‍රතිසංස්කරණ මගින් එය ඌනපූරණය විය යුතු ය. වඩාත් හොඳින් ස්ථාපිතව ඇති සහ කීර්තිමත් නීතිපති දෙපාර්තමේන්තුවට අදාලව ප්‍රතිසංස්කරණ අධ්‍යයනය කිරීම හා හඳුන්වා දීම ඉතා දුෂ්කර කාර්යයක් විය හැකි බව සිහියේ තබා ගනිමින්, මෙම වාර්තාව ඔස්සේ සාධනීය සාකච්ඡාවකට ප්‍රයෝජනවත් ආරම්භයක් ලබා දීමට අපේක්ෂා කරනු ලබන්නේ, නීතිපති කාර්යාලය සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති වඩාත් පුළුල්ව විහිදී ඇති සේම සමහර ප්‍රශ්න සම්බන්ධයෙන් බොහෝ රටවල් දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති ගැටළු සම්බන්ධයෙන් අදාල සමහර ප්‍රතිසංස්කරණ සඳහා අදහස් සපයන බැවින්ය.

***